The magazine by

# පෙරමග

සිව්වන වෙළුම - දෙසැම්බර් 2022

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය, ආදි ශිෂ්‍ය සංගමයේ, පෙරමග දශක කණ්ඩායම විසින් සම්පාදිතයි.

තුමෙහි කිච්චං ආතප්පං

පෙරමග 2001-2010 කණ්ඩායම

## යළි ගොඩනැගෙන ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය කාර්යභාර්ය.



### ▪ ගුරු තරුව

ධර්මපාලය ගැන මේ තරම් අභිමානයකින් කථා කරන්නේ ශිෂ්‍යාවක්, ගුරුවරියක්, නියෝජ්‍ය විදුහල්පතිනියක් මෙන්ම ආදි ශිෂ්‍යාවක් වශයෙන් ධර්මපාලයට ඉමහත් සේවයක් ඉටුකළ යමුනා ආරියසිංහ ගුරු මාතාවයි.

### ▪ පෙරමග නියමුවෝ

"සාමූහිකත්වය" තමා එකම සාර්ථකත්වය..
ශයාන් රුක්ෂාන් පෙරේරා

"අපට තිබූ විශාලම ශක්තිය තමයි අපගේ සාමාජික සාමාජිකාවන් "
සනත් ලසන්ත පෙරේරා

### ▪ පෙරමග 15th Anniversary

2007 මැයි මස 15 වන දින ආරම්භ කළ පෙරමග දශක කණ්ඩායම මේ වන විට පසලොස් වසරක අභිමානවත් ගමනක් සනිටුහන් කර ඇත.

Scan the QR code to access the e-version of Peramaga Magazine

# INTERNATIONAL DEGREE PATHWAYS AT NCHS

COMMENCE HIGHER STUDIES AFTER O/Ls or A/Ls AND TRANSFER TO REPUTED UNIVERSITIES ABROAD.



## MOST TRUSTED EDUCATION PROVIDER

nchs
NAWALOKA COLLEGE OF HIGHER STUDIES

### DEGREE PATHWAYS

- Engineering
- Hospitality Management
- Health Science
- Business
- Information & Communication Technology
- Liberal Art
- Law
- Biomedical Science
- Psychology

**PARTNER UNIVERSITIES**

Swinburne University of Technology · Federation University · La Trobe University Australia · University of Tasmania · Ulster University · SUNY Empire State College · California State University Monterey Bay · University at Albany · California State University Northridge · Fresno State · Sacramento State · California State University San Marcos · Sweet Briar College · Salisbury University · University of Kentucky · University of North Alabama · University of Lynchburg · King's

Call Rishard on **076 666 1920** | **nchs.edu.lk**

NCHS Colombo, 546/3, Galle Road, Colombo 03

M-036

# ENRICH CORPORATION SOLUTIONS (PVT) LTD

Enrich

FEEL THE MAGIC OF BUSINESS

Company Registration, Accounting, Book - keeping
Tax consultancy Services, Payroll Management

No. 76 A/2/1, Purana Rd, Wattegedara, Maharagama.
Tel: 0115108810 / 0112 160286 / 0772336819
E Mail: hnkaudit@gmail.com , chathuranga.enrich @ gamil.com

## පෙරමග දශක කණ්ඩායම විධායක සභාව
## 2022- 2023

**සභාපති** - චමිඳු විජයවර්ධන 071- 8984600

**ලේකම්** - තිළිණි ෂාලිකා තිලකරත්න 077- 1789715

ප්‍රධාන
**උප සභාපති** - ශිවන්ත කොස්වත්තගේ 077-7787548

**උප සභාපති** - හර්ෂ රණසිංහ 076-5364036
අමිල මෛත්‍රීපාල 071-3022012

ප්‍රධාන
**උප ලේකම්** - යසන්ත ඉන්දීවර 071-4499821

**උප ලේකම්** - ගයානි කොස්වත්තගේ 071-4445772
දිනේෂා ජයමාන්න 076-6661080

**භාණ්ඩාගාරික** - එල්. එස්. සාරංග පීරිස් 077-7541918

**උප භාණ්ඩාගාරික** - අශාන් කලුබෝවිල 076-7487315

**සංවිධායක** - එල්.ඩබ්. ජනිත දේශප්‍රිය 075-2944801

**උප සංවිධායක** - ජේ.එම්.පී.ටී.ජයසේකර 071-7920157

**සංස්කාරක** - උදාර කත්‍රිආරච්චි 071-5649333

**ද්වි වාර්ෂික**
**සංවිධායක** - සංජීව කාරියවසම් 077-4049109

**හිටපු සභාපති** - පෙවින්ද බැලගම 077-2789316

### කාරක සභිකයින්

බුද්ධික අමරසිංහ
සඳුන් උත්පල ගමගේ
උදාර ආරියවංශ
ඩී. පී. සුසිත් දුෂාන්ත
නිරෝෂා ඇල්විටිගල
චාමලී නිසංසලා
ජේ. චන්දික චතුරංග
චමිඳු නුවන් කුලසේකර
ඉරේෂා මධුවන්ති
දුල්මි විජේනායක
පී. ඒ. චින්තක සමීර
කුෂාන් රත්නතරංග
තුෂානි තමරා පෙරේරා
පත්මිලා ප්‍රියදර්ශනි
අරුණි මධුෂානි දිසානායක
අචිනි ලියනගේ
හියල් බියගමගේ
හංසිනි සෙනෙවිරත්න
අධීෂ තරිඳු මාලිංග
සම්පත් උදයංග

# සඟරා කමිටුව

2022 දෙසැම්බර් - සිව්වැනි කලාපය




**සංස්කාරක**
උදාර කත්‍රිආරච්චි (1)

**විශේෂාංග ලිපි සැකසීම**
චමිඳු විජයවර්ධන (2)
තිළිණි තිලකරත්න (3)
යසන්ත ඉන්දීවර (4)
ගයානි කොස්වත්තගේ (5)
දිනේෂා ජයමාන්න (6)
උදාර කත්‍රිආරච්චි (1)
චාමලී නිසංසලා (7)
හියල් බියගමගේ (8)
සම්පත් උදයංග (9)
ඉරේෂා මධුවන්ති (10)
අචිනි ලියනගේ (11)
නිෂාදි රුක්ෂානි (12)
ගයනි විජේකෝන් (13)

**පරිගණක නිර්මාණකරණය**
නිෂාදි රුක්ෂානි (12)
ප්‍රියදර්ශනි පත්මිලා (14)

**දැන්වීම් සම්බන්ධීකරණය**
යසන්ත ඉන්දීවර (4)
චාමලී නිසංසලා (7)
ඉරේෂා මධුවන්ති (10)
අචිනි ලියනගේ (11)
ගයනි විජේකෝන් (13)

**සෝදුපත් පරීක්ෂාව**
බුද්ධික වැලිවිට (15)
චමිඳු විජයවර්ධන (2)
තිළිණි තිලකරත්න (3)
දිනේෂා ජයමාන්න (6)
හියල් බියගමගේ (8)

**අනුශාසක මණ්ඩලය**
බුද්ධික වැලිවිට (15)

# CONTENT

Pages


සුභාශිංසන සහ කතු වැකිය 06 - 07

පෙරමග 15th Anniversary 09

ගුරු තරුව 10 - 11

සිසු විවේකාගාරය 13
15 වන මහා සභා වාර්තාවෙහි සාරාංශය

The First, Lady Pricipal of Dharmapala Vidyalaya Pannipitiya 14 - 16

පෙරමග නියමුවෝ - 1 18 - 19

යළි ගොඩනැගෙන ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය කාර්යභාර්ය 20 - 21

ගෙවුණු වසරක පියසටහන් 22 - 28

දම්පල් මිණිකැට 30 - 31

රම්‍ය දියදහර 32 - 33

පෙරමග නියමුවෝ - 2 34 - 35

මතකාවර්ජන 38 - 42

Randoms Photos 44 - 45

කැටපත් පවුර 46

Game Zone 47

අපේ පුංචි සිත්තරුන් 50

ස්තුතිය 52


## PERAMAGA DECADE GROUP - EXECUTIVE COMMITTEE - 2022/2023
Past Pupils' Association of Dharmapala Vidyalaya Pannipitiya



**Front Row** : Pevinda Balagama (Former President), Janitha Deshapriya(Organizer ), Ashan Kalubowila (Vice Treasurer), Harsha Ranasinghe( Deputy Vice President), Shiwantha Koswaththage (Vice President), Saranga Pieris (Treasurer), Chamindu Wijayawardhana (President), Thilini Shyalika Thilakarathne (Secretary), Yasantha Indeewara (Vice Secretary), Dinesha Jayamanne (Deputy Vice Secretary), Udara Kathriarachchi (Editor), Sanjeewa Kariyawasam (Bi-annual Coordinator), J. M. G. T. Jayasekara (Deputy Organizer).

**Back Row** : Nirosha Elvitigala, Dulmi Wijenayake, Susith Dushantha, Adeesha Tharindu Malinga, Chamindu Nuwan Kulasekara, Sandun Uthpala Gamage, Buddika Amarasinghe, Hiyal Biyagamage, Sampath Udayanga, Chandika Chathuranga, Chinthaka Sameera, Iresha Maduwanthi, Hansini Senevirathna, Thushani Thamara Perera.

**Absentees** : Amila Maithreepala (Deputy Vice President), Gayani Koswaththage(Deputy Vice Secretary) , Achini Rangika Liyanage, Aruni Dissanayake, Udara Ariyawansa, Chamali Nisansala, Kushan Rathnatharanga, Pathmila Priyadarshani (Committee Members)



## විදුහල්පතිතුමියගේ සුභාශිංසන

පෙරමග දශක කණ්ඩායම විසින් වසරක් පාසා නිකුත් කරනු ලබන පෙරමග සඟරාව මෙම වසරේ සිව්වැනි වරටත් පෙරමග නාමය ඉහළින් ඔසවා තබමින් අති සාර්ථක ලෙස එළි දැක්වීම පිළිබඳ ව ප්‍රථමයෙන් මම මාගේ සුභාශිංසන පෙරමග දශක කණ්ඩායම වෙත පිරිනම මි.

පැවති කොවිඩ් වසංගත තත්ත්වය යම්තාක් දුරට අඩුවීමත් සමග යම් ආකාරයකින් අඩපණ වී තිබූ අධ්‍යාපන කටයුතු මෙම වසරේ මැදභාගයේ සිට සාර්ථක ආකාරයෙන් යථා තත්ත්වයට පත් කිරීමට අපට හැකි විය. එම ක්‍රියාවලියේ දී දරුවන් සහ ගුරුවරයා අතර සම්බන්ධතාවය සුභවාදී ආකාරයෙන් ගොඩනැගීමට ද අප පාසලට හැකියාව ලැබුණි. එමෙන්ම, මෙම වසරේ දී අප පාසලට අධ්‍යාපන, ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් වලින් විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වූ බව සිහිපත් කරනුයේ ඉතාමත් සතුටිනි.

පුරා වසර 15 ක් මුළුල්ලේ පෙරමග දශක කණ්ඩායම පාසලේ සුභ සිද්ධිය උදෙසා සිදුකරනු ලබන ව්‍යාපෘතීන් වලදී මූලිකත්වය ගෙන කටයුතු කළ දශක කණ්ඩායමක් වශයෙන් හැඳින්විය හැකි අතර එම කණ්ඩායම මගින් මෙම වසරේ දී ද පාසලේ සිදුකරන ලද ව්‍යාපෘතීන් සඳහා සෘජුවම සම්බන්ධ වෙමින් පාසලේ උන්නතිය සඳහා විශාල වැඩ කොටසක් සිදුකල බවද සඳහන් කළ යුතුය.

තවද කළ යුතු කාර්යයන් ඉතා හොඳින් හඳුනාගනිමින්, ඉතාමත් සංවිධානාත්මකව කාර්යයන් ක්‍රියාත්මක කිරීම, සාර්ථකව නිම කිරීම මෙන්ම පසුවිපරම ද මනාව සිදු කිරීම පෙරමග කණ්ඩායමේ සුවිශේෂී ගුණාංගයක් ලෙස අගය කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

එමෙන්ම මෙවන් සඟරාවක් එළි දැක්වීමේ දී ඇතිවන සියලුම බාධක මැඩගනිමින් ඉතාමත් සාර්ථකව මෙම කාර්යය නිමකිරීමට අවශ්‍ය ශක්තිය සහ ධෛර්යය පෙරමග කණ්ඩායමේ සභාපතිතුමා ඇතුළු සඟරා කමිටුවට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**මහේෂිකා රූපසිංහ**
විදුහල්පතිනිය
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිතුමන්ගේ සුභාශිංසන

වසර පහළොවක සාර්ථක ගමනක් සනිටුහන් කර ඇති "පෙරමග" දශක කණ්ඩායමට ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති ලෙස සුභාශිංසන එක් කරනුයේ ඉමහත් සතුටිනි.

විවිධ නව ව්‍යාපෘති සිදුකරමින් නිරන්තරයෙන් පාසලේ සංවර්ධන කටයුතු සඳහා දායක වන "පෙරමග" කණ්ඩායම, ආදිශිෂ්‍ය සංගමයේ සහ අනෙකුත් සංගම් වල කටයුතු සඳහා ද ලබාදෙන ඉහල දායකත්වයට ස්තුතිපූර්වක වීමට මෙය අවස්ථාවක් කරගනිමි.

"පෙරමග" දශක කණ්ඩායම විසින් වාර්ෂිකව නිකුත් කරන පෙරමග සඟරාවේ සිව්වන කලාපය එළි දැක්වීම සඳහා කැපවීමෙන් කටයුතු කරන සියලු දෙනාට සුභාශිංසන එක් කරන අතර ඔබ සංගමයේ ඉදිරි කටයුතු සාර්ථකව සිදු කරමින් විද්‍යාලයීය නාමය තව තවත් ඔප් නැංවීමට, සභාපති තුමා ප්‍රමුඛ සියලු සාමාජිකයින්ට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**දීපාල් හේරත්**
විධායක සභාපති,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම්තුමාගේ සුභාශිංසන

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ 2001 - 2010 වර්ෂවල ආදි සිසු සිසුවියන් නියෝජනය කරන "පෙරමග" දශක කණ්ඩායම 4 වන වරටත් නිකුත් කරනු ලබන "පෙරමග" පුවත් සඟරාවට, ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන් සුභාශිංසන එක් කරනුයේ ඉමහත් සතුටිනි.

කීර්තිමත් සිසු පරපුරක් බිහි කළ දම්පල් විදු මෑණියන්ගේ හා සිසු පරපුරේ උන්නතිය වෙනුවෙන් උදාර සේවාවක් ආදි සිසුන් ලෙස මෙම කණ්ඩායම ඇතුළු සියලුම කණ්ඩායම් එක් ව ඉටු කිරීමට හැකි වීම භාග්‍යයක් කොට සලකමි.

දේශීය වශයෙන් මෙන් ම ගෝලීය වශයෙන් ද වසර කිහිපයක් පුරා පැවැති පීඩාකාරී තත්ත්වයන් හේතුවෙන්, දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ද බාධාවක් ඇති වීම නොවැලැක්විය හැකි කරුණක් විය. තත්ත්වය එසේ වුවත් අප ආදි සිසු සංගමය හා පාසල් සංවර්ධන කමිටුව අත්වැල් බැඳ ගනිමින්, විදුහල්පතිතුමියගේ මූලිකත්වයෙන් ගුරු මණ්ඩලයේ කැපවීමෙන් හා උනන්දුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමට ක්‍රියා කිරීමට දරනු ලබන උත්සාහය ඉතා අගය කළ යුතු ය.

මාතෘ භූමියේ උන්නතිය වෙනුවෙන් කැප විය හැකි මතු පරපුරක් බිහි කිරීමේ භාරදූර කාර්යය ඉටු කරනුවස් විවිධ වැඩසටහන් පවත්වමින් කරනු ලබන සේවාව ඉදිරියටත් කරගෙන යාමට හැකි වේවා! යි ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**රොහාන් වැලිවිට**
ප්‍රධාන ලේකම්.
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## පෙරමග දශක කණ්ඩායමේ සභාපතිතුමාගේ සුභාශිංසන

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීම සහ ශක්තිමත්ම දශක කණ්ඩායම වන පෙරමග දශක කණ්ඩායමේ වත්මන් නියමුවාණන් වීමට ලැබීම මා ලද භාග්‍යයකි. වසර 15ක ඉතිහාසයක සිට මේ දක්වා පෙරමග ඔසවා තැබීමට ඇප කැපවී අවංක සේවයක් ඉටු කළ සියලුම සාමාජිකයන්ට කෘතඥපූර්වක වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

වසර 3ක අත්දැකීම් සමග පෙරමග සඟරාව 4වන කලාපය එළිදැක්වීමට හැකියාව ලැබීම අප කණ්ඩායමට මහත් සතුටකි. පෙරමග ඉතිහාසය හා වර්තමානය සමඟින් තවත් විශේෂාංග ලිපි කිහිපයක් ඉදිරිපත් කිරීමට අපි මේ හරහා උත්සාහ කළෙමු. එපමණක් නොව ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යාපෘතින් හා විද්‍යාලයීය සියලුම අංශවල දක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හැකියාවන් අගය කිරීමෙන් ධර්මපාලයීය නාමය තවත් සුභවාදීව සමාජගත කිරීම අපගේ අභිලාශය යි. ඒ සඳහා ඇප කැප වී ක්‍රියා කල සඟරා කමිටුවට සම්බන්ධ සියලුම සාමාජිකයන්ට මම ස්තුතිවන්ත වෙමි.

මෙම සඟරාව තුල ගැවසෙන ඔබට "පෙරමග" කෙතරම් ඵලදායීව හා ක්‍රියාකාරීව පාසලේ භෞතික සම්පත් සංවර්ධනයට සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනික, ක්‍රීඩා හා සෞන්දර්යාත්මක කුසලතා වර්ධනය සඳහා දායකත්වය දක්වන්නේ ද යන්න මනාව පැහැදිළි කර ගත හැක.

ඉදිරියේදී ද එවැනි ව්‍යාපෘති තව තවත් ක්‍රියාත්මක කරමින් රටට ඵලදායී මානව සම්පතක් බිහි කිරීම උදෙසා දායකත්වය සැපයීමට පෙරමගට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

තරු පෑයු අහසේ නැගුන සුපුන් සඳ සේ පෙරමග සදා දිනේවා!

**චමිඳු විජයවර්ධන**
**සභාපති ( 2022 - 2023 )**
පෙරමග දශක කණ්ඩායම,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.



## පෙරමග දශක කණ්ඩායමේ ලේකම්තුමියගේ සුභාශිංසන

පෙරමග දශක කණ්ඩායමේ 15 වන සංවත්සරයත් සමඟ ම නොකඩවා සිව්වැනි වරටත් පෙරමග සඟරාව එළිදැක්වීමට ලැබීම සතුටට කරුණකි. පෙරමග යනු සැබැවින්ම සහෝදරත්වයේ හා එකමුතුකමේ පූර්වාදර්ශයයි. අප සාමාජික සාමාජිකාවන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම වර්ෂයේදී පාසලේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ උන්නතිය වෙනුවෙන් ඵලදායී ව්‍යාපෘතීන් රාශියක් පාසලට දායාද කිරීමට අප කණ්ඩායමට හැකියාව ලැබුණි. එම සෑම ව්‍යාපෘතියකදීම ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ භේදයකින් තොරව අප කණ්ඩායමේ සියලුම සහෝදර සහෝදරියන්ගෙන් ලද දායකත්වය හා ශක්තිය අමතක කළ නොහැක. එම සියලුම සහෝදර සහෝදරියන්ට මාගේ ප්‍රණාමය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙම වර්ෂයේ පෙරමග සඟරාව එළිදැක්වීමේ දී එයට දායකවෙමින් තම කාලය, ශ්‍රමය හා ධනය කැපකල සඟරා කමිටු සාමාජිකයන්ටත් වෙළඳ දැන්වීම් ලබා දෙමින් හා සුභපැතුම් එක් කරමින් අප තව තවත් ශක්තිමත් කළ සියලුම ආයතන හා අප ආදි ශිෂ්‍යයන්ටත් මාගේ හදපිරි ප්‍රණාමය පුද කර සිටිමි.

එමෙන්ම ඉදිරියටත් මෙවැනි ව්‍යාපෘතීන් සාර්ථකව සිදුකරමින් පෙරමග තවත් ඉහළට ඔසවා තැබීමට අප සංගමයේ සියලුම සාමාජික සාමාජිකාවන්ට ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවායි මම ප්‍රර්ථනා කරමි.

**තිළිණි ශ්‍යාලිකා තිලකරත්න**
**ලේකම් ( 2022 - 2023 )**
පෙරමග දශක කණ්ඩායම,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.



## කතු වැකිය

# සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට අනාගතය දකිනා ශිෂ්‍ය පරපුරක් බිහි කරමු !

කොවිඩ් වසංගතයෙන් පසුව ශ්‍රී ලංකාව වෙලාගත් ආර්ථික අර්බුදය නිසා අප සියලු දෙනාම දැඩි ගැටළු රැසකට මේ වනවිට මුහුණ පාමින් සිටියි. දැඩි උද්ධමනය, විරැකියාව ඉහළ යාම සහ දැවැන්ත බුද්ධි ගලනය හේතුවෙන් වර්තමාන ශ්‍රී ලාංකීය සමාජ පසුබිම විශාල පරිවර්තනයකට ලක්වෙමින් තිබේ.


මෙවැනි පසුබිමක් තුළ, වත්මන් ශිෂ්‍ය පරපුර වෙත පැවරී ඇත්තේ භාරදූර කාර්යයකි. එනම් ශ්‍රී ලංකාව යහපත් මාවතක් වෙත රැගෙන යමින්, ආර්ථික සහ සමාජීය වශයෙන් දියුණු රටක් බවට පරිවර්තනය කිරීමේ දැවැන්ත කටයුත්ත සඳහා පාර්ශවකරුවන් වීමයි. නමුත් මෙය ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. මන්ද යත්, දිනෙන් දින ව්‍යාකූලත්වයට පත්වන අප රටේ ආර්ථික, සමාජීය සහ දේශපාලන පසුබිම තුල, සමස්ත ශිෂ්‍ය ප්‍රජාව මතද අධික පීඩනයක් පැටවී ඇති නිසායි.

කෙසේ නමුත්, නව අධ්‍යාපන අවස්ථා (මාර්ගගත අධ්‍යාපනය - online education), අනාගතයට ඔබින නව නිර්මාණ (future-proof innovations) සහ ශ්‍රී ලංකාව වෙත විදේශ විනිමය ලබාදෙන රැකියා අවස්ථා වෙත ශ්‍රී ලාංකීය ශිෂ්‍ය ප්‍රජාවේ අවධානය යොමුවිය යුතුය. බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ වනවිටත් මෙම අවස්ථා පිළිබඳව උනන්දුවක් දක්වන අතර, මේ පිළිබඳව තොරතුරු සොයා දී ඔවුන් දිරිමත් කිරීම වැඩිහිටි ප්‍රජාවට පැවරී ඇති වගකීමකි.

2022 න් අනතුරුව එළඹෙන වසර කිහිපය ශ්‍රී ලංකාවට අභියෝගාත්මක වන බව නොරහසකි. මෙම අභියෝග ජයගෙන, මීළඟ දශකය තුල ශ්‍රී ලංකාවේ දිශානතිය වෙනස් කිරීමේ වැදගත් කර්තව්‍යයේ මූලිකත්වය ගැනීමට වර්තමාන සිසු පරපුර දැන් සිටම සූදානම් කළ යුතුයි. ඒ වෙනුවෙන් අප සියලු දෙනාම එක්විය යුතු අතරම, මෙම ව්‍යායාමයේ ප්‍රතිඵල නුදුරු අනාගතයේදීම ළඟාකර දෙමින්, අනාගත දරු පරපුර වෙත යහපත්, සංවර්ධිත ශ්‍රී ලංකාවක් උරුම කර දීමට අදිටන් කර ගනිමු.

**උදාර කත්‍රිආරච්චි**
**සංස්කාරක (2022-2023)**
පෙරමග දශක කණ්ඩායම,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.

# Sri Lanka's No1 Supplier of Pipeline Materials




SINCE 1930

## ALLIED TRADING INTERNATIONAL (PVT) LTD

# 301 OLD MOOR STREET, COLOMBO 12 011-739 7777 alliedint@eureka.lk www.allied.lk

M-019

Best Wishes From

Lahiru Gamage

2009 A/L

M-015



Well Wishes!!

CHEMIDEN

One of leading one-stop solutionprovider to
fulfill the raw material
and instrumental requirements with the
endless possibilities

# 15th ANNIVERSARY

## පෙරමග

### 2001-2010 කණ්ඩායම

**2007 මැයි මස 15** වන දින ආරම්භ කළ පෙරමග දශක කණ්ඩායම මේ වනවිට පසලොස් වසරක අභිමානවත් ගමනක් සනිටුහන් කර ඇත. මෙම කාලය තුළ පාසලේත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේත්, ආදි සොයුරු සොයුරියන්ගේත් අවශ්‍යතාවන් සපුරමින් ධර්මපාල නාමය දිදුලවන්නට අප සංගමයට හැකියාව ලැබී ඇත. අපගේ පාසලේ මෙන්ම විවිධ අවස්ථාවලදී පාසලින් පරිබාහිරව ද, විවිධ අවශ්‍යතාවන්ට මැදිහත් වෙමින් පුරවැසි වගකීම ඉටුකිරීමද පෙරමගෙහි විශිෂ්ටත්වයයි. බොහෝ අභියෝගාත්මක අවස්ථාවලදී පවා සාමාජික සාමාජිකාවන්ගේ ඇප කැපවීමත්, නිසි සැලසුම්කරණයත් සමග සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට අප හට හැකිවිය.

අප ගමනට මහත් ආශිර්වාදයක් වෙමින්, වසර 15ක් සම්පූර්ණ වන **2022 මැයි මස 15** වන දිනයේ වෙසක් පුන් පොහොය දින යෙදී තිබූ අතර එදින ගරුතර සංඝරත්නයේ වැඩමවීමෙන් උදෑසන පිරිත් සජ්ඣායනය කිරීම විද්‍යාලයීය බුදු මැදුරෙහිදී සිදු කරන ලදී. ඉන් අනතුරුව **15 වන සංවත්සරය** සැමරීම වෙනුවෙන් සංවිධානය කළ උත්සවයේ කටයුතු ආරම්භ කළ අතර ඉදිරි වැඩකටයුතු සම්බන්ධයෙන් සියලු දෙනා දැනුවත් කිරීමද වර්තමාන සභාපති චමිඳු විජයවර්ධන සොහොයුරා විසින් සිදු කරන ලදී.

මෙම වැඩසටහන සඳහා විදුහල්පතිතුමිය, ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමන් ඇතුලු නිළධාරීන්, පෙරමග හිටපු සභාපතිවරුන් සහ ලේකම්වරුන් ඇතුලු බොහෝ පෙරමග සාමාජික සාමාජිකාවන් පිරිසක් සහභාගී විය.

උදාර කත්‍රිආරච්චි








# ගුරු තරුව

**ධර්මපාලය ගැන මේ තරම් අභිමානයකින් කථා කරන්නේ ශිෂ්‍යාවක්, ගුරුවරියක්, නියෝජ්‍ය විදුහල්පතිනියක් මෙන්ම ආදි ශිෂ්‍යාවක් වශයෙන් ධර්මපාලයට ඉමහත් සේවයක් ඉටුකළ**
**යමුනා ආරියසිංහ ගුරු මාතාවයි.**



අප එනතුරු මතක සටහන් පොදි බැදගෙන මග බලා සිටි ඇයගේ සුන්දර මතක පෙළ ගස්වන්නට අපි ඇය සමග පිළිසඳර මෙසේ ආරම්භ කළෙමු.

**ඔබතුමිය ධර්මපාල විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යාවක්. ඔබතුමියගේ ළමා කාලය හා පාසල් කාලය ගැන මතකය අවදි කළොත් ?**

මම ඉපදුණේ 1950 ජනවාරි 24 වෙනිදා. අපේ ගෙදර තිබුණේ කොට්ටාව ආනන්ද විදුහල භූමියේමයි. අධ්‍යාපන ආයතන පරිශ්‍රයේම නිවසක ඉපදීමත් දෛවෝපගත සිදුවීමක් විදියටයි මට දැනෙන්නේ. අයියලා දෙන්නා සහ මල්ලිත් පාසල් ගියේ ධර්මපාලයටමයි. විභාගයකින් තමා ළමයින්ව පාසලට තෝරගන්නේ. මගේ ඇතුළත් වීමේ අංකය 3078. මගේ නිවාසය නන්ද. පාසල් කාලයේ දී මම අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන ගියා. විෂය බාහිර කටයුතු වලදී නර්තනයට තමයි ආසාව සහ දක්ෂතාව වැඩිපුර තිබුණේ. සංගීතයෙන් හා නර්තනයෙන් සමස්ත ලංකා තරග වලට ඉදිරිපත් වී ප්‍රථම ස්ථාන පවා ලබා ගත්තා.

> **"අද මම මේ තත්වයෙන් ඉන්නේ ධර්මපාලය නිසා. මගේ සාර්ථකත්වයට මූලික හේතුව මගේ පාසලයි."**

මාලතී සෝමබන්ධු ගුරු මහත්මිය නිර්මාණය කරන ලද "සකුණිකා" මුද්‍රා නාට්‍ය ප්‍රසිද්ධ වේදිකාවේ වේදිකා ගත කරන්නත් අවස්ථාව ලැබුණා. සංගීතය හැදෑරුවේ ලයනල් රන්වල ගුරු මහතාගෙන්. ක්‍රීඩා කටයුතු වලටත් හැකි උපරිමයෙන් සහභාගි වුණා. අවසානයේ නන්ද නිවාසයේ නිවාස නායිකාව ලෙසත් කටයුතු කළා.



ඒ කාලේ 8 ශ්‍රේණිය අවසාන වාර විභාග ප්‍රතිඵල වලින් තමයි සාමාන්‍ය පෙළ විෂය ධාරාව තෝරන්නේ. ගණිතය උගන්වපු කරුණාසේන සර් කිව්වා ඔයා ගණිතය අතහරින්න එපා දිගටම ගණිතය කරගෙන යන්න කියලා. උසස් පෙළදී අපේ පන්තියේ ළමයි 35න් හිටිය එකම ගැහැණු ළමයා මම!

1970-1971 වර්ෂයේදී මම පාසලේ "ප්‍රධාන ශිෂ්‍ය නායිකාව" ලෙස කටයුතු කළා. 1971 දී මම පාසල් දිවියට සමුදුන්නා. ඒ කාලේ අවුරුදු 15ක් පමණ පාසලේ ඉන්න පුළුවන්කම තිබුණා

**පාසල් කාලයේ සිදුවූ සුන්දර අත්දැකීම් ගැනත් අපි මතක් කරමු.**

තුනේ පන්තියේ ඉඳලා වාර විභාගයෙන් 1,2,3 තෝරනවා. රිපෝට් එක දෙන්නේ විදුහල්පතිතුමා අතින් ප්‍රධාන ශාලවේදී. ඒ කාලේ ප්‍රධාන ශාලාවට යන්න ලැබෙන්නේ හරිම කලාතුරකින්. අවුරුදු නිවාඩුවට කලින් උත්සවේ තිබ්බේ. මගේ නම කියනකොට තමයි දන්නේ මම පන්තියේ පළවෙනියා කියලා. එදිරිසිංහ මහත්මයා තමයි එතකොට විදුහල්පති. මට රිපෝට් එක දීලා ඔළුව අතගාල කිව්වා "ගම්මිරිස් ඇටයක් විතර ඇති, අවුරුද්දට හොඳට කාලා ලොකු වෙලා එන්න කියලා." ඒ වගේම මට තව අමතක නොවන සිදු වීමක් තියෙනවා. ඒ තමා මම පාසලේ 12 ශ්‍රේණියේ ඉගෙන ගනිද්දී "ගොළු හදවත" චිත්‍රපටය රූගත කිරීම් සිදු කිරීම.

## ගුරුවරියක් විදියට අපේ පාසලට සම්බන්ධ වුණේ කොහොමද?

පාසල් කිහිපයකම ගුරුවරියක් විදියට සේවය කළා. 1972 පළවෙනි පත්වීම ලැබුණේ විද්‍යා ගණිත ගුරුවරියක් විදියට රත්නපුරේ ඈත පාසලකට. ඒ පාසල දුර වැඩියි කියලා අධ්‍යාපන කාර්යාලයෙන්ම පැල්මඩුල්ල හුණුවල මහා විද්‍යාලයට පත්වීම හදලා දුන්නා. පාසල් කීපයකම උගන්නගෙන යද්දී මට තේරුණා මං අයිති ධර්මපාලෙට කියලා. 1991 දී මට ධර්මපාලෙට එන්න අවස්ථාව ලැබුණා.



මම මුලින්ම පාසලට ආවේ පන්ති භාර ගුරුවරියක් විදිහට. ඊළඟ අවුරුද්දේ ශ්‍රේණි ප්‍රධානී තනතුර ලැබුණා. අවුරුදු දෙකකට පමණ පසු සහකාර විදුහල්පතිනියක ලෙස වගකීම ලැබුණා.

## නියෝජ්‍ය විදුහල්පතිනියක් ලෙස පත්වුණේ කොයි කාලයේ වගේද ?

මම අධ්‍යාපන පරිපාලන සේවා විභාගය කළා. එහි ප්‍රතිඵල ලැබුනේ නැහැ. ඒ අතර වර්ෂ 2000 දී මීපේ ජාතික අධ්‍යාපන ආයතනයේ පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරලා විශිෂ්ට සාමාර්ථයක් ලබා ගත්තා. ප්‍රතිඵල ආවට පසු 2002 ඔක්තෝබර් 07 වැනි දා ධර්මපාලයේ නියෝජ්‍ය විදුහල්පතිනියක් විදියට වැඩ බාර ගත්තා.

විශ්‍රාම ගන්නකල්ම පාසල් කළමනාකරණ කමිටුවේ සාමාජිකාවක් විදියටත් පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකාවක් විදියටත් සේවය කළා. මම කුමන තනතුරක් දැරුවත් 10, 11 ශ්‍රේණි වල ගණිතය ඉගැන්වීම කිසි දවසක අත් හැරියේ නැහැ.

## ගුරුවරියක් වශයෙන් සේවය කිරීමේ දී සිදුවූ අමතක නොවන සිදුවීම් එහෙම ඇති නේද?

පළවෙනි පත්වීම ලබුණු පාසලේ ළමයින්ට හවස් වරුවේ මම ගණිතය ඉගැන්වූවා. එක දවසක් 8 ශ්‍රේණියේ දරුවෙක් ගාණක් හදන්නේ නැතුව ඉන්නවා දැකලා ළමයා බලාපොරොත්තු නැති වෙලාවක මම අඩි කෝදුවෙන් පිටට පාරක් ගැහුවා. අනේ... ඒ ළමයා ගැස්සිලා හැරිලා බැලුවා. ඒ බැල්ම මට දරාගන්න බැරි වුණා... විෂය සම්බන්ධ ගැටලුවකදී කවදාවත් දඬුවම් කරන්නේ නැහැ කියලා මම එදා තරයේ හිතාගත්තා. විශේෂයෙන් කියන්න ඕන 1991 මම පාසලට එනකොට ගණිතය ප්‍රතිඵල 47% යි. 1999 වෙනකොට 97% දක්වා ප්‍රතිඵල වැඩි කරන්නට අපිට පුළුවන් වුණා. එය එවකට හිටපු සහකාර විදුහල්පතිනිය හැටියට මට විශාල සතුටක්.

මම අඩුවෙන්ම නිවාඩු ලබා ගත්ත ගුරුවරියක් විදියට වසර කීපයක්ම ත්‍යාග ප්‍රදානෝත්සවයේදි ඇගයීමට ලක් වෙලා තියෙනවා.

## ආදි ශිෂ්‍ය සංගමයේ දරපු තනතුරු සහ ආදි ශිෂ්‍ය සංගමය ගැන ඔබතුමියගේ අදහස් කොයි වගේද?

මම 1991 දී කාරක සභිකයෙක් ලෙස සංගමයේ ක්‍රියාකාරීව වැඩ කරන්න පටන් ගත්තා. ඊට පසු උප සභාපති, උප ලේකම්, ප්‍රධාන ලේකම් තනතුරුවලටත් විනය කමිටුවටත් තේරී පත් වුණා.

ආදි ශිෂ්‍ය සංගමය පාසලේ සංවර්ධනයට ඉතා වැදගත්. දරුවන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න ආදි ශිෂ්‍ය සංගමය හරහා අවස්ථාව ලැබුණා.

විශේෂයෙන්ම කියන්න ඕන පෙරමග දශක කණ්ඩායමෙන් දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම ඉතාම වැදගත්. එය මම ඉතාම අගය කොට සලකනවා. පාසලේ කරන බොහෝ ව්‍යාපෘති මගින් පාසල් සංවර්ධනය වගේම පාසල් දරුවන්ගේ කටයුතු පහසුවෙනවා. ඒ සම්බන්ධව පෙරමග කණ්ඩායමට ස්තූතිවන්ත වෙනවා.

## ශිෂ්‍යාවක්, ගුරුවරියක්, කළමනාකරණ නිළධාරිනියක්, ආදි ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වශයෙන් ධර්මපාලයීයන්ට ඔබතුමිය ලබාදෙන පණිවිඩය කුමක්ද?

මම ලැබූ තනතුරු කුසලතා සියල්ල ලබා ගත්තේ ධර්මපාලයේ ඉගෙන ගත්ත නිසා කියන හැඟිම මගේ හිතේ තියනවා. අද මගේ දරුවොත් මේ තත්වයේ ඉන්නේ ධර්මපාලය නිසා. ඉගෙන ගත්ත පාසලට අපි හදවතින්ම සලකන්න ඕන.

පාසලේ කැපී පෙනෙන ශිෂ්‍යාවක් වශයෙන් ගුරුවරුන්ගේ සිත් දිනාගත් ඇය ගුරුවරියක් වශයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ද ආදි ශිෂ්‍යාවක් වශයෙන් ධර්මපාලයීයන්ගේ ද සිත් දිනාගත්තාය.



ඉතින් මේ ආදරණීය ගුරු මාතාව සමග කතා බහ නිමා කොට අප ඇයගේ නිවහනින් නික්ම ආවේ ඇයට නිදුක් නිරෝගි දීර්ඝායුෂ පිරි දිවියක් ප්‍රාර්ථනා කරමින්.

**චාමලී නිසංසලා/ යසන්ත ඉන්දීවර**

M-026

# NISSICO HOLDINGS

Importers, Wholesale & Retail Dealers in
all Type of Office Stationery,
School Stationery, Computer Stationery,
Paper, Paper Board,
Printing & Packaging Materials

**MACPAP** COMPUTER FORMS & STATIONERY
Manufactures of Computer Paper (Blank & Printed)

50, Maliban Street, Colombo 11, Sri Lanka
Tel: +94 11 2336885, 2333847 Fax: +94 11 2333847
Mobile : 077 3222383 E-mail: nissico@slt.lk

M-027

# ROWER INTERNATIONAL



Contractors and manufacturers representative
Importers of Steel and Engineering Equipment

364 – 1/1 Old Moor Street, Colombo 01200, Sri Lanka

T : +94 (0) 11 239 1700
F : +94 (0) 11 239 9700
M : +94 (0) 77 763 4321
E : rowerint@yahoo.com
W : www.rower.lk

M-031

"පොතක් යනු ඔබට නැවත නැවතත් විවෘත කළ හැකි තිළිණයකි..."

"A Book is a gift you can open again & again..."

*- Garrison Keillor*

mulakuru.lk

**Best Kids Story Books**
**at your doorstep.**

SCAN ME

071 603 9458

www.mulakuru.lk

# සිසු විවේකාගාරය

## දම්පල් සිසුවියන් වෙත තිළිණ කළ වගයි....





වර්තමානය වන විට අප පාසලේ ක්‍රීඩිකාවන් විසින් දම්පල් මාතාවගේ නාමය බබළවමින් පාසල වෙත ජයග්‍රහණ රාශියක් රැගෙන එමින් පවතී. නමුත් ඔවුන් මෙලෙස පාසල වෙත ජයග්‍රහණ රැගෙන එන්නේ බොහෝ අපහසුතා හා බාධක මධ්‍යයේ බව අප විසින් සිදු කරන ලද සොයා බැලීම් වලදී දැන ගන්නට ලැබිණි. මෙම ක්‍රීඩිකාවන්ට තිබූ ප්‍රධාන අඩුපාඩුවක් වූයේ නියමිත ප්‍රමිතියකින් යුතු ක්‍රීඩා විවේකාගාරයක් නොමැති වීමයි.

මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ වගකීමට උර දෙමින් අප පෙරමග සාමාජිකයින් දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වෙමින් තම වටිනා කාලය, ශ්‍රමය හා ධනය වැය කරමින් ක්‍රීඩිකාවන් සඳහා සියලුම පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්ණ වූ නව ක්‍රීඩා විවේකාගාරයක් ඉදිකර සියලුම වැඩ කටයුතු අවසන් කර ලබා දුන්නේ ඉමහත් වූ සතුටකිනි.

මෙසේ අප සාමාජිකයන්ගේ කැපවීමෙන් ඉදි වූ ක්‍රීඩා විවේකාගාරය 2022-10-20 වන දින දම්පල් ක්‍රීඩිකාවන් හට සියලුම දෙනාගේ පැසසුම් මැද තිළිණ කරන ලදී.

**ගයානි කොස්වත්තගේ**

## 15 වන මහා සභා වාර්තාවෙහි සාරාංශය

ක්‍රි.ව. 2022 ක් වූ පෙබරවාරි මස 20 දින පෙ.ව.9.00 ට පන්නිපිටිය තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මහා සභා රැස්වීමේ කටයුතු ආරම්භ විය. 15 වන මහා සභා රැස්වීමට පැමිණි සියලු දෙනා පිළිගනිමින් ගරු සභාපති පෙවින්ද බැලගම මහතා පිළිගැනීමේ කතාව පැවැත්වූ අතර පැමිණ සිටි සියලු දෙනා වෙත ලබා දී තිබූ 2021 පෙබරවාරි මස 23 වන දින පැවති 14 වන මහා සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත විය.

ඉන් පසුව ගිණුම් වාර්තාව ගරු භාණ්ඩාගාරික හර්ෂ රණසිංහ මහතා සහ උප භාණ්ඩාගාරික තිළිණ භාග්‍ය අබේසේකර මහතා සභාවට ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය. අනතුරුව පැවති ප්‍රගති සමාලෝචනයේදී 2021/2022 පරිපාලන වර්ෂයේ දී අප සංගමය මගින් සිදුකරන ලද ව්‍යාපෘති පිළිබඳ ගරු සභාපති පෙවින්ද බැලගම මහතා සහ ගරු ලේකම් ධනංජ ඇල්විටිගල මහතා සභාවට සවිස්තරාත්මකව ඉදිපරිත් කරන ලද අතර පසුගිය වසර වෙනුවෙන් ගරු ලේකම් ධනංජ ඇල්විටිගල මහතා ස්තූති කතාව සිදු කළේය.

අනතුරුව ගරු විදුහල්පතිතුමිය සභාව අමතමින් කොවිඩ් 19 අභියෝගයක් කර නොගනිමින් පෙරමග කණ්ඩායම විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් සිදුකර ඇති බව සඳහන් කළාය. ආදි ශිෂ්‍ය සංගමයේ ගරු විධායක සභාපතිතුමන් පෙරමග කණ්ඩායම ඇගයීමට ලක් කළ අතර ඉදිරියේදී ද පාසලේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන මෙන් ඉල්ලා සිටියේ ය.

ඉන් අනතුරුව පසුගිය වර්ෂයේ නිළධාරී මණ්ඩලය ඉල්ලා අස් වී නව නිළධාරී මණ්ඩලය, ඉදිරිපත් කළ නාමයෝජනා සහ සභාවේ කැමැත්ත පරිදි නිළධාරීන් තෝරා පත් කර ගැනුණි.

ඒ අනුව චමිඳු විජයවර්ධන මහතා නව සභාපති ලෙසත් තිළිණි ශ්‍යාලිකා තිලකරත්න මහත්මිය නව ලේකම් ලෙසත් පත්විය. ඉන්පසු ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සමාලෝචනයක් ව්‍යවස්ථා සංශෝධන කමිටු ලේකම් නයෝමාල් ඉඹුලාන මහතා සභාවට ඉදිරිපත් කළේය. අනතුරුව විළඹි අදහස් හා යෝජනා වාරයේ දී බුද්ධික වැලිවිට මහතා, නයෝමාල් ඉඹුලාන මහතා සහ රුසිරු බැලගම මහතා යෝජනා කිහිපයක් සභාවට ඉදිරිපත් කළ අතර ගරු විදුහල්පතිතුමියගේ අදහස් දැක්වීමක් ද සිදුකරන ලදී. නව සභාපති චමිඳු විජයවර්ධන මහතාගේ කතාවේදී ඉදිරි වසර තුළ දී සිදු කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති යෝජනා කිහිපයක් සැකෙවින් ගෙන හැර දක්වමින් ඉදිරි වසර සාර්ථක කරගැනීමට සියලු දෙනාගේ සහයෝගය ද අවශ්‍ය වන බව ප්‍රකාශ කළේය. ඉක්බිතිව නව ලේකම්තුමිය, තිළිණි ශ්‍යාලිකා තිලකරත්න මහත්මියගේ ස්තූති කතාවෙන් අනතුරුව සභාතොමෝ සතුටින් විසිර ගියහ.



**තිළිණි ශ්‍යාලිකා තිලකරත්න**

# THE FIRST, LADY PRINCIPAL WHO BROUGHT NEW CONCEPTS, THE MODERN ART OF CONCEPTUAL EDUCATION AND FAME TO DHARMAPALA VIDYALAYA, PANNIPITIYA



Dharmapala Vidyalaya, one of the greatest mix schools in Sri Lanka, is supposed to be the biggest mix school in South East Asia. Last year, it was fortunate to have her first woman Principal Madam Maheshika Rupasinghe, over the prodigious history of 82 years. She started her career as a teacher and, through her untiring effort, rose to the position of Director of Education as a Class – 1 career officer in the Sri Lanka Education Administration service (SLEAS). From the point of view of the Peramaga Decade Group, she is very talented in her profession, highly efficient, well-mannered, honest and dedicated to the cherishment of our Alma matter.

Below is an excerpt from an interview we had with her:

## 1. What made you join this profession?

Although I was born in Colombo, my father, the only child in the family, wanted to move into his parental home at Hindagla. It is a stunning area down the road running from Peradeniya towards Galaha through Peradeniya Campus, only one kilometer from the campus. I studied at Pushpadana Girls' College in Kandy and actively participated in many co-curricular activities apart from academic studies, including sports and aesthetics. I have received many national-level awards in many of those. In fact, I wanted to become a Lawyer by profession. Eventually, I was dragged into the field of education after the completion of my higher studies in science

I have obtained a BSc degree in Physical Science and MSc in Science Education, along with a post-graduate Diploma in Education from the University of Peradeniya. I joined the Department of Education as a teacher in 1992 and got my first posting as an English Teacher at a Tamil School at Rahathungoda in Hewaheta.

In 2006, I got through the examination of Sri Lanka Education Administrative Services and joined the SLES cadres becoming a deputy principal of Viharamahadevi Balika Vidyalaya Kandy and Principal of Swarnamali Balika Vidyalaya Kandy.

Upon completing my tenure as a principal, I was posted to the Zonal Education Office Kandy as the Director of Education (Development) and in charge of 12 subjects in 121 schools under the Zonal Education Office – Kandy for ten years before joining Dharmapala Vidyalaya.

In addition to all the above, I performed as a Visiting Lecture for Post Graduate Diploma in Education and a Masters' Degree in science education at the University of Peradeniya.

## 2. What are some unforgettable memories during your tenure in Kandy?

I was the Director in charge of subjects such as Social Cohesion, interrelation among ethnic groups in Sri Lanka and related activities to perform in schools. It was totally out of my purview of education, but I took up the challenge. Anyway, I started liking it, developed

my concepts and put them into practice. Most of them were unorthodox but worked on the ground very well, and people started to appreciate them. Before everything, I did an in-depth study of how peace can be built up and achieved within the family, at home, in a group and in society.

In that context, I started two National Level programmes under the Ministry of Education called 'Denuwara Mithuro' and 'Senehasaka Thaksalawa'. Through these initiatives, I managed to organise national-level events where Sinhala youth from schools in Kandy visited schools in Jaffna, Vavuniya, Ampara and Batticaloa and vice versa, meeting each other and sharing their cultural experiences, meeting, eating, greeting and other interests. They all enjoyed that, and we could see that from their faces than how they explained in words.

Apart from that, I was appointed as Subject Director of Social Sciences, Library and Information Sciences and the "Mother Sri Lanka" National Programme. I was also working as a National level resource person for Library and Information Sciences. My contribution to "Ratak Watina Pothak" national programme as the coordinator for Zone Education Office in Kandy produced a record-breaking 5000 books, the highest number ever made by any education zone on the island.

Leaving aside all the above, I was the Director of Education (Development) at the Zonal Education Office in Kandy. Under my leadership, we reached first place for best O/L result out of all education zones in the country in 2015 and 2016. I am delighted and proud to have led all such events, which are some of my unforgettable events in life.

### 3. How do you feel and envisage being the first lady principal of Dharmapala Vidyalaya?

I strongly feel that the arrival at Dharmapala Vidyalaya is my destiny. My father was the editor of Mahabodhi Magazine, published by the Mahabodhi Society of India for 22 years. He is well conversant with all Great Anagharika Dharmapala and Mahabodhi Society activities in India and Sri Lanka. He is one of the veterans in the media sector who has written many articles and books on the philosophy of the great Anagarika Dharmapala while working for the Mahabodhi Society in India.

What has happened today, for the first time in the history of your school, is the change of environment from a father's care to a mother's care. In such a context, the perspective of the father and the mother to wards every activity changes accordingly to suit the existing requirements. The outcome also changes in a different way and that it self maybe a diverse experience for everyone.

Being a mixed school, Dharmapala Vidayalaya itself is a big experience for me. Management of academics and administration of a mixed have certain advantages and disadvantages equally. On certain issues, I get into



serious trouble in solving them without being prejudiced to either party. When I consider the student population and the range of activities in our school, it is almost the size of two girls' and boys' schools put together.

With my experience in the system of education, I have learnt a lot from the ground level to the level of a Director handling policy matters in the field of education. With that inspiration, I wanted to return to a school as the principal, where I enjoyed the development in every aspect of the school, which gave me great satisfaction. That was why I decided to take up the post of principal at your school.

Although I was offered some popular national schools from Colombo at the selection interview, I opted to join your school to bring the school to par excellence, fulfilling all expectations of this prestigious school's present and past pupils. I am thrilled and proud to be with you all.

### 4. What are your plans to uplift the school in the next few years?

To put it rightly, our school should be well organised to face the next few years' challenges. I as the principal should have the vision to forecast that and get things arranged accordingly. We must have our main goal and dreams as to how this school could be developed further.

To achieve our target, comprehensive, well-organised projects/programmesmust be planned and implemented soon. First and foremost, I must identify the strengths and weaknesses in every aspect of the school. It took a lot of my time to study and analyse them to address them most appropriately and practically through my 30 years of experience to bring them up to my expected standard. The areas I considered were mainly education development, co-curricular activities, sports administration, professional development of teachers and non-academic staff and how to get on with the inhabitant around the school and the Past Pupils' Association.

Since I took over your school as the principal, for the past 11 months, I have been planning and launching development programmes while devoting most of my time to ongoing school activities, which is my priority. Academic education is the primary goal and responsibility of any school. We give a child 13 years of school education to reach the best position in his life, which is the utmost expectation of any parent. Along with education, we provide all the necessary facilities for a child to choose a preferred sport out of 18 games and 30-odd co-curricular activities to further excel in their school careers.

Further more, I plan to introduce new educational concepts and programmes from grades 6 to 13 and to primary section to develop their potential in education. In addition to that, special education training programmes will be organised for grade 5, GCE O/L and A/L students. Special seminars, online programmes and all relevant activities are organised to guide the students, utilising the maximum contribution and assistance of the respective teachers and resource personnel. We aim to achieve the top possible result and a higher number of students who are eligible to enter universities. Our students have done relatively well at the last GCE (A/L) 2022 examination, and a reasonable number of students have been able to enter the university.

In par with academics, co-curricular activities, especially the sports arena, have started achieving their goals. We have national level championships and awards in many sports including cricket, rifle shooting, athletics, gymnastic, aquatic gymnastic, chess, and badminton, conducted by Sri Lanka School Associations. Those are remarkable achievements for Dharmapala Vidyalaya. We all should be very proud of our students who brought honour to the school and, at the same time, should be thankful for their coaches and the Masters in charge of games for their effort and dedication. I am thrilled that we are on the verge of reaching our goals in the sports circle.

How ever, the essential part of education needs to be included in our conversations. At the end of all our efforts, the country must have well-mannered, cultured, disciplined, active and educated citizens. We can produce active and knowledgeable citizens through formal education and sports. But that alone won't make a person perfect. To avoid the imbalance, we get them involved in aesthetic programmes such as music, dancing, drama and other related activities. This gives children some relaxation and at the same time allows children who need to take up them as their profession in the future.

Our students have taken part in many national-level dancing and music competitions. They have been awarded 1st place in many events competing with well-recognised schools on the island. We are very proud of them, and credit should go to the teachers in charge of those events. However, the activities they organise in the school are enjoyed by the rest of the staff and the students, which helps others who are not directly involved to relax a bit out of their hectic schedules. It helps them to improve their



personalities, career prospects and mannerism to become good citizens, which is most required by our country.

Ultimately, my ambition is to create as many exemplary Palians who give credit and follow the steps of great Anagarika Dharmapala to uphold his vision and expectations as required by our motherland today.

In this exercise, I expect cooperation from the students, teachers, other staff, parents and the past pupils of Dharmapala Vidyalaya to carry this laudable task to your expectations.

Hiyal Biyagamage/ Sampath Udayanga




**4 M INTERNATIONAL (PVT) LTD.**

No.137, High Level Road, Kandalanda,
Homagma, Sri Lanka.

4mdaily4m@gmail.com

Location

**4M DAILY**

**070 377 78 78**

www.4minternationalgroup.com

**011 285 56 14**

**070 154 39 38**



# පෙරමග නියමුවෝ

## "සාමූහිකත්වය" තමා එකම සාර්ථකත්වය..

### ගයාන් රුක්ෂාන් පෙරේරා

**පෙරමග නියමුවෝ** ලිපි මාලාවේ පළමුවන දිගහැරුම අප පෙරමග පළමු සාමාජිකයන් සමඟ සිදුකරන්න තීරණය කලා. ඒ අපේ සංගමයේ නිර්මාතෘ, කණ්ඩායමට පුරෝගාමී මෙහෙවරක් සිදු කළ, පෙරමග දශක කණ්ඩායමේ පළමු වන සභාපතිතුමා වන ගයාන් රුක්ෂාන් මහතා සමග,

**ඉතින් ගයාන් අයියේ, කොහොමද මේ දවස් වල තොරතුරු.**

ඇත්තටම දැන් අවුරුද්දකට විතර ආසන්න කාලයක් පුරාම වැඩිපුරම ඉන්නේ මීගමුව ප්‍රදේශයේ...''රැල්ල වෙරළට ආදරෙයි'' නාට්‍යයේ දෙවන කැමරාකරණය ලෙස කටයුතු කරනවා. ඉතිං ගෙදර ඉන්න දවස් ගාන අඩුයි.. ඒ හින්දම යාලුවෝ හමුවීම්, ආදි ශිෂ්‍ය සංගමයේ අවස්ථාවන්, ගමේ ක්‍රීඩා සමාජයේ වැඩ වගේ එකතුවීම් මග ඇරිලා තියෙන්නේ... පසුගිය ටිකේ පෙරමගේ කරපු වැඩ කටයුතු ඔක්කෝම වගේ මග ඇරුනා.. දුකයි ඉතිං කට්ටිය එක්ක එකතු වෙලා කයියක් ගහගෙන පරණ දේවල් මතක් කර කර සතුටු වෙන්න තිබ්බ අවස්ථාවන් මග ඇරෙනකොට...

**ඔබේ පාසැල් කාලය ගැන මතකය ආවර්ජනය කළොත්,**

මගේ මුල් පාසල කොට්ටාව ධර්මපාල විද්‍යාලය.. 5 වසර ශිෂ්‍යත්වය සමත් වෙලා තමා මම පන්නිපිටිය ධර්මපාලයට ඇතුළත් වෙන්නේ. ළමා කාලයෙන් තාරුණ්‍යයට පියමනින කාලසීමාව පන්නිපිටිය ධර්මපාලය තුළ ගෙවුණ නිසා මං ගොඩක්ම එකතු වෙන්නේ පන්නිපිටිය ධර්මපාලයත් එක්ක. තව දෙයක්, මගේ තාත්තගේ සහෝදර සහෝදරියන් සහ මගේ සහෝදරයා සහ සහෝදරිය ඉගෙන ගත්තෙත් පන්නිපිටිය ධර්මපාලයේ. දැන් මගේ නංගිගේ පුතාලා 3 දෙනත් යන්නේ මේ පාසලටමයි.

ශිෂ්‍යත්වයෙන් පන්නිපිටිය ධර්මපාලයට ආවට පාසල ගැන සැබෑ හැඟීමක් ඇතිවෙන්න පටන් ගන්නේ උ.පෙළ අධ්‍යාපනය ආරම්භ වීමත් එක්ක.

මං පොඩි කාලයේ ඉඳන්ම මගේ ප්‍රධාන විෂය වුනේ චිත්‍ර කලාව. සාමාන්‍ය පෙළ අවසාන කාලය වෙනකොට සාහිත්‍ය සංගමයේ අයියලා අක්කලා කරන සාහිත්‍ය වැඩකටයුතු ගැන සැලකිල්ලක් දැක්වූවා. මං චිත්‍ර අඳින නිසා සාහිත්‍ය සංගමයේ විවිධ අලංකරණ කටයුතු වලට සම්බන්ධ වුණා. මට මතකයි අපි 10 වසරට එනකොට ලොකු සම්පත් අයියා (හරි නම සම්පත් පෙරේරා) එයා තමයි වර්තමානයේ ටවර් හෝල් නාට්‍ය පාසලේ අධ්‍යක්ෂකතුමන්. ඊට පස්සේ තුමිඳු දොඩන්තැන්න අයියා, එයාලා තමා සාහිත්‍ය සංගමයේ ප්‍රධානීන් වුණේ, ඒ දවස් වල අපේ සාහිත්‍ය සංගමය කියන්නේ දැවැන්ත කාර්යයක් ඉටු කරන සංගමයක්. ධර්මපාලයේ කලා උළෙල කිව්වම ඒ කාලයේ පාසල් අතර ලොකු පිළිගැනීමක් තිබ්බා... අවුරුද්දෙන් අවුරුද්ද නිලධාරීන් පත්වුණේ ඡන්දයකින්. ඒ තරම් තරගයක් තිබ්බා මේ සංගමයට. ඒ වගේම තමා එහෙම පත් වුණ අය පාසල තුළ කලාව පිළිබඳව කරපු වැඩ. අපිට ඒව දකින්න ලැබුන එකෙන් අපිට ඒ අත්දැකීම් විඳින්න පුලුවන් වුණා. මං හිතනවා වර්තමානයේ මම කලා ක්ෂේත්‍රයේ වෘත්තීයමය වශයෙන් නියැලෙනවා නම් එදා අපි පාසලේ දී ලබා ගත් අත්දැකීම් තමයි ඒකට බලපෑවේ කියලා. තවත් වටිනා දෙයක් සිද්ධ වුණා, අපේ උසස් පෙළ වසර දෙකේ දී එක එක විෂයයන් වලට බෙදිලා හිටියට අපි හැමෝම එකට හිටියා... එක එක විෂයන් වලට අදාළව පවත්වපු සමරු දින වැඩසටහන් සංවිධානය කරද්දී අපි හැමෝම එකට එකතු වුනා. වාර්ෂික ක්‍රීඩා උත්සවයේදීත් නිවාස හතරේම සැරසිලි වලට අපි උදව් කරනවා. අපි 2001 දී පළවෙනි පාරට කලා උළෙල මූලික කරගෙන දින 3 ක සාහිත්‍ය වැඩසටහන් පෙළක් සංවිධානය කළා.

අද හිතෙනවා අපි ඒ කාලේදී වර්තමානයේ වගේ ෆෝන්, ඉන්ටර්නෙට් නැතුව මේ වගේ දේවල් කොහොමද කළේ කියලා. ඒ ගැන හිතෙනකොට මට හිතන්නේ අපි පාසල් කාලයේ දී ගොඩනගා ගත්තු සාමුහිකත්වය තමා පාසල් ළමුන් විදියට ඒ වගේ ලොකු වැඩ කරන්න හේතු වුණේ කියලා..



**අපි අහල තියෙනවා ගයාන් අයියා පාසල තුළ ඉතාමත් ක්‍රියාකාරී ශිෂ්‍යයෙක් කියලා, පාසල් සමයේ සිදුවුණ අමතක නොවන සිදුවීමක් මතක් කලොත්...**

ඇත්තටම ඒ කාලයේ අපි කරපු දේවල්, වැඩ කරන්න ගිහින් වෙච්ච දේවල් හැම එකක්ම වගේ අමතක කරන්න බැරි සිද්ධි තමා. ඒවා තමා අපි කට්ටිය අද එකට හම්බුවුනාම මතක් කර කර රස විඳින්නේ.. ඒවා ඉතිං ප්‍රසිද්ධ කරන්න ඕන නෑ නේද?

**කොහොමද පෙරමග දශක කණ්ඩායම බිහි කරන්න අදහස ආවේ ?**

ඇත්තටම අපිට පාසල් කාලය තුළදීවත්, පාසලෙන් ඉවත් වීමෙන් පසුවත් ආදි ශිෂ්‍ය සංගමයක් ගැන ලොකු අවබෝධයක් තිබුනේ නෑ.. පාසලෙන් ඉවත් වූ පසුවත්, අපේ හමු වීම් තැනින් තැන සිදු වුණා. ඔය අතරේ තමා 2006 අග දී විතර මට, සනත්ට සහ තවත් කිහිප දෙනෙක්ට අදහසක් මතු වෙන්නේ 'අපිට ආයිත් එකතු වෙන්න තැනක් හදා ගමු' 'ඒකට හොඳම දේ තමා 2001-2010 ආදි ශිෂ්‍ය කණ්ඩායමක් හදන එක' කියලා, ඒ තීරණයෙන් තමයි මේ වැඩේ පටන් ගත්තේ. ඉතිං අපි ඒ මොහොතේ ළඟින්ම හිටපු යාලුවෝ ටික එකතු කරගෙන හමුවීම් වට කිහිපයක් තියලා 2007 දී ''පෙරමග'' දශක කණ්ඩායම ගොඩ නැගුවා. අපිට ඕන වුණේ එදා පාසලෙන් පිටවෙනකොට හිටිය කට්ටිය නැවත එකතු කරගන්න. අපි එදා පළවෙනි මහා සභාවේදි අවධාරණය කරනවා, මේ හදපු ආදි ශිෂ්‍ය කණ්ඩායම හරහා ඔබට ඔබේ පාසල වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමත්, ඒ වාගේම තම අයිතිවාසිකම් ලබා ගැනීමත් යන දෙකම සිදු කිරීමට අවකාශය ලැබෙනවා කියලා. අද වෙනකොට පෙරමගෙන් අපේ පාසලට සිදු වන සේවාව ගැන ඇත්තටම ආඩම්බරයක් තියෙනවා.

අපෙන් පස්සේ මේ සංගමය බාර ගත්තු සහෝදර සහෝදරියන් අපි එදා බලාපොරොත්තු වුන අරමුණ ඉතා හොඳින් සම්පූර්ණ කරමින් ඉදිරියට යාම ගැන අපි අවංකව සතුටු වෙනවා...

**එදා එලෙස ආරම්භ කළ පෙරමග දශක කණ්ඩායම අද වන විට වසර 15 ක් පුරාවට අති සාර්ථක ගමනක් ඇවිත් තියනවා. පෙරමග අනාගත සාමාජිකයන්ට ඔබ ලබා දෙන පණිවිඩය කුමක් ද?**

අපි එදා ආරම්භයේදී යම් කිසි පණිවිඩයක් ආදර්ශයක් දුන්නා නම් එයත් රැකගෙන නව අදහස් එකතු කරගෙන යන මේ ක්‍රියාවලියට තවත් අලුතින් පණිවිඩයක් දෙන්න අවශ්‍ය නෑ කියලා මං හිතන්නේ. මං හිතනවා මේ වන විට ''පෙරමග'' කණ්ඩායම විසින් පාසලටත් අනෙක් ආදි සිසු කණ්ඩායම් වලටත් පණිවිඩයක් දෙමින් තම කාර්යභාරය සාර්ථකව සිදුකරගෙන යනවා කියලා.. ඉතිං අපි ආඩම්බරයි. සමාජිකයන් විදියට වර්තමානයේ දී සහ අනාගතයේදී මේ ''පෙරමග'' ට නායකත්වය දෙන සහෝදර සහෝදරියන්ට මම අවංක හිතින් සුබ පතනවා.

අවසාන වශයෙන් කියන්න තියෙන්නේ ''සාමූහිකත්වය තමා එකම සාර්ථකත්වය ..''




එදා දුටු සිනහව අදත් එලෙසම විඳිමින් ඔහුගේ අනාගත බලාපොරොත්තු , ප්‍රාර්ථනා එලෙසම ඉටුවේවායි සුභ පතමින් අපි ගයාන් රැක්ෂාන් මහතාගේ නිවසින් නික්මුණෙමු.

ඉරේෂා මධුවන්ති





# යළි ගොඩනැගෙන ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය කාර්ය භාරය

ලොව පුරා සීග්‍රයෙන් පැතිර යමින් තිබූ කොවිඩ් 19 වෛරසය ආසාදිත පුද්ගලයින් මෙරටින් හඳුනාගැනීමත් සමඟ රජය විසින් ආරක්ෂිත පියවර කිහිපයක් අනුගමනය කරන ලදි. එහි පළමු පියවර ලෙස පාසල් සඳහා නිවාඩු ලබාදුන් අතර ක්‍රමයෙන් රටතුල සිදුවූ රෝග ව්‍යාප්තිය නිසා සෙසු අංශ සඳහා ද නිවාඩු ලබාදෙමින් වෛරසය පැතිරීම පාලනයක් සිදුකෙරිණි. කාලයත් සමඟ අධ්‍යාපන ක්‍රමය මාර්ගගත ක්‍රම වලට යොමු වූ අතර දරුවන් ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතු වලින් ඈත්ව තාක්ෂණික මෙවලම් සමඟ ගතකිරීමට යොමුවිය. දුරකථන සම්බන්ධතා ගැටළු නිසා දුෂ්කර ප්‍රදේශවල සිසුන්ට මෙම මාර්ගගත ක්‍රම සමග සම්බන්ධ වීමේදී විවිධ ගැටළු ඇතිවූ අතර ඒ වන විටත් බොහෝ පිරිසකගේ එදිදෙනා ආදායම් මාර්ග අවහිරවීම නිසා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා නව උපකරණ මිලදී ගැනීමේ අපහසුතාවන් පැවතිණි. මේ නිසා මාර්ග ගත ක්‍රම හරහා අධ්‍යාපන කටයුතු සිදු කිරීම බොහෝ පිරිසකට ගැටළුකාරී විය.

මෙම වසංගතය හමුවේ අනෙකුත් රටවල්ද විවිධ ආරක්ෂිත පියවරයන් අනුගමනය කරමින් ජනතාව වෛරසය ආසාදනයෙන් ආරක්ෂා කිරීමට කටයුතු කළ අතර ඒ සමඟ බොහෝ රටවල් සංචරණ වාරණයන් පැනවිය. ඒ සමඟ තෙවැනි විශාලතම විදේශ ප්‍රේෂණ සම්පාදකයා වූ සංචාරක කර්මාන්තය කඩාවැටීමත්, විදේශ රැකියා නියුක්තිකයින් විශාල ලෙස නැවත ලංකාවට පැමිණීමත් නිසා විදේශ විනිමය හිඟයකට මුහුණදීමට සිදුවිය. වෛරසය මැඩපැවැත්වීම උදෙසා එන්නත් කිරීම් සිදුකිරීමත් සමග නැවතත් පූර්ව වසංගත තත්ත්වයට සමාජය පත්වෙමින් තිබුණ ද ආර්ථිකය කළමණාකරණය කිරීමේ විවිධ දුර්වලතා නිසා රටේ ආර්ථිකය දැවැන්ත අර්බුදයකට පත්විය. මෙවන් වාතාවරණයක යළි ගොඩනැගෙන ශ්‍රී ලංකාව තුළ ශිෂ්‍යයාගේ කාර්යභාරය සුවදායක රටක් නිර්මාණය කිරීම කෙරෙහි ඉලක්කගත විය යුතුය.

අතීත ශ්‍රී ලංකාව දෙස බලනවිට මෙරට තාක්ෂණික අංශයන්ගෙන් දියුණු, පරිපූර්ණ ස්වයංපෝෂිත රටක් ලෙස පැවතී ඇති බවත්, ජනතාව වර්තමානයට වඩා යහපත් ජීවන රටාවක් ගතකර ඇති බවත් පෙනීයයි. භූගෝලීය පිහිටීම අනුව ඇතිවූ බලපෑම් මත එම කාලවල විවිධ පසුබෑම් වලට ලක්වූව ද රට නැවත ස්ථාවරත්වයට පත්වීමට අවශ්‍ය මූලික ශක්තිය රට තුල තිබූ බැවින් නිවැරදි කළමණාකරණයක් මත එම සෘණාත්මක බලපෑම් වලින් මිදීමට එවකට හැකියාව ලැබුණි. නමුත් වර්තමානය තුළ යළි නැගීසිටීම වඩාත් අභියෝගාත්මක වෙයි. පවතින ආර්ථික දුෂ්කරතා නිසා බොහෝ පිරිස්

**Earnings and unemployment rates by educational attainment, 2021**




Note: Data are for persons age 25 and over. Earnings are for full-time wage and salary workers.
Source: U.S. Bureau of Labor Statistics, Current Population Survey.

විදේශගත වීමද අපට රටක් ලෙස නැගී සිටීමට බාධා පමුණුවයිනමුත් බහුතරයකට එම විසඳුම ප්‍රායෝගික නොවන බැවින් රටතුල ඇති විසඳුම් පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්වීම වඩාත් යෝග්‍ය වෙයි.

පසුගිය කාලසීමාව තුල අප ආනයන මත වැඩි වශයෙන් යැපීම නිසා බොහෝ විදේශ ප්‍රේෂණ අත්‍යාවශ්‍ය නොවන ආනයන සඳහා වැය කල අතර රට තුල නිෂ්පාදනය කළ හැකි ඉතා සරල උපකරණ හා ආහාර වර්ග පවා ආනයනය කිරීම සිදුකෙරිණි. මෙවන් පසුබිමක් තුල රට යළි නගා සිටුවීමට නම් වත්මන් ශිෂ්‍ය පරපුර සුවිශේෂී කාර්යභාරයක් ඉටුකිරීම වෙනුවෙන් කැපවිය යුතුය.

ශිෂ්‍යයින් බහුතරයක් සමාජය තුළ උසස් යැයි සම්මත රැකියා වෙනුවෙන් පමණක් සිය උසස් අධ්‍යාපනය කරගෙන යයි. නමුත් ඔවුන්ට අනාගත රැකියා වෙළඳ පොළ පිළිබඳ යාවත්කාලීන වූ අවබෝධයක් නොමැත. එබැවින් ඔවුන් සාම්ප්‍රදායික මාර්ග වලම ගමන් කරමින් ඉහළ ආදායම් අපේක්ෂා කරමින් සිටියි. නව අධ්‍යාපන ක්ෂේත්‍ර ගැන ඔවුනට අවබෝධයක් නොමැති අතර බොහෝ වැඩිහිටියන් ද සම්මත රාමුවෙන් පිටතට පිවිසීමට බියක් දක්වයි.

නමුත් ශිෂ්‍යයින් ලෙස පුළුල් අධ්‍යයනයන් සිදුකරමින් නව රැකියා සඳහා මාර්ග විවර කරගත යුතුය. මේ සඳහා බොහෝ අවස්ථාවන් වලදී ගැටළුකාරී වී ඇත්තේ ජාත්‍යන්තර භාෂා පිළිබඳ ඇති දැනුම ප්‍රමාණවත් නොවීමය. එම ගැටළුව




නිරාකරණය කරගැනීමට සුදුසු විසඳුම් අන්තර්ජාලය හැසිරවීමෙන් හා පුස්තකාල පරිහරණයෙන් සොයාගත හැකි වුවත්, බොහෝ දරුවන් විවිධ ඵල රහිත දේ සිදුකරමින් වටිනා කාලය හා ධනය විනාශ කරගැනීම කණගාටුවට කරුණක් වී ඇත. අප අසල්වැසි රටවල් පවා අන්තර්ජාතික රැකියා අවස්ථාවන් පුරෝකථනය කර අවශ්‍ය මානව සම්පත් ඒ වෙනුවෙන් සංවර්ධනය කරමින් සිටියි. එක්සත් ජනපද කම්කරු සංඛ්‍යා ලේඛන කාර්යාංශය විසින් 2021 වසර සඳහා ප්‍රකාශිත දත්ත අනුව, ඩිප්ලෝමා සහිත පිරිසෙන් 6.2% පිරිසක් රැකියා වියුක්ත බව පෙනීයයි. එම දත්ත සලකා බලන විට බොහෝ පිරිස් උසස් අධ්‍යාපන අවස්ථා සඳහා වැඩි වශයෙන් යොමු වී ඇති නිසා අඩු සුදුසුකම් සහිත අය සඳහා අවස්ථා අහිමි වී ඇත. මෙම විරැකියා ප්‍රතිශතයන් සසඳන විට උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාව හොඳින් තහවුරු වේ.

එම කාර්යාංශය විසින්ම 2021 වසරේ සිට 2031 දක්වා සිදුකර ඇති පුරෝකථනයන්ට අනුව වඩාත් වේගයෙන් වර්ධනය වන ක්ෂේත්‍රය වන්නේ හෙද වෘත්තියයි. ඊට අමතරව අවන්හල් ආශ්‍රිත රැකියා, ක්‍රීඩා ආශ්‍රිත රැකියා වැඩි වශයෙන් වර්ධනය වන බව පෙනී යන නමුත්, අප එම පුරප්පාඩු පිරවීමට සූදානම් ද යන්න නැවත නැවතත් සිතා බැලිය යුතුය. ඉදිරි දශකය තුළ කාර්මික අංශයේ ද සැලකිය යුතු වර්ධනයක් සිදුවන බව සුළං විදුලි බලාගාර කාර්මිකයින් ද මෙම ක්ෂේත්‍ර තුලට අතුලත් කිරීම තුළින් පෙනීයයි. මේ වනවිටත් තාක්ෂණික ක්ෂේත්‍ර සඳහා වැඩි ඉල්ලුමක් ඇති බැවින් සිසුන් තක්ෂණ අංශයන් කෙරෙහිද වැඩි නැඹුරුවක් දැක්විය යුතුය. ස්වයං විනයක් ඇති කරගනිමින් අනාගත ඉලක්ක වෙනුවෙන් කැපවෙමින් ඵලදායී ලෙස අධ්‍යාපනයේ යෙදීම වර්තමාන සිසු පරපුරේ වගකීමකි. එය තම අනාගතය වෙනුවෙන් සිදු කලයුතු ආයෝජනයකි.

වර්තමානය වනවිට දරුවන් අධ්‍යාපන කටයුතු සමග කාර්යබහුල වීම නිසා ක්‍රියාශීලී බවෙන් අඩුවී ඇත. ජංගම දුරකතන, පරිගනක වැනි තාක්ෂණික උපකරණ සමග වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් ක්‍රීඩා කටයුතු වලින් ඈත්ව ඇති නිසා දරුවන් අක්ෂි දෝෂ වැනි විවිධ රෝගාබාධ වලට වැඩි වශයෙන් ගොදුරුවීමේ ප්‍රවණතාවක් පසුගිය කාල වකවානුව තළ නිරීක්ෂණය වී ඇත. ක්‍රීඩා කටයුතු වලින් ඈත්වීම නිසා බොහෝ දරුවන්ගේ ඉවසීම, සහයෝගීතාව, දරාගැනීමේ ශක්තිය වැනි ගුණාංග අඩුවීමක් දක්නට ලැබේ. අනාගත යහපත් ශ්‍රී ලංකාවක් උදෙසා පුරවැසියා සෞඛ්‍ය සම්පන්න විය යුතුය.

"ක්‍රීඩාව විශ්වාස කළ යුතු ධර්මයක් මිස දිනා ගත යුතු පදක්කමක් නොවේ" යැයි ප්‍රකට කියමනක් ඇත. ක්‍රීඩාව තුළින් ලැබෙන කායික මානසික නිරෝගීකම මගින් ප්‍රසන්න පුද්ගලයෙකු නිර්මාණය වන අතර ධෛර්ය, ආත්ම ශක්තිය හා ඉවසීම ද ඒ හරහා පුරුදු පුහුණු වීමට අවස්ථාව සැලසෙයි. වඩා වේගයෙන් වර්ධනය වන වෘත්තීන් අතර ද, ක්‍රීඩා සම්බන්ධ වෘත්තීන් කිහිපයක් ද සටහන් වී ඇති අතර කම්කරු සංඛ්‍යා ලේඛන කාර්යාංශ වාර්තා අනුව එම වෘත්තීන් සඳහා 2021 වසරේ සාමාන්‍ය වාර්ෂික වැටුප රු.35,000/-සිට රු.77,000/- දක්වා ඉහල අගයක් පෙන්නුම් කරයි. එබැවින් අනාගත රැකියා වෙළඳපොළ මෙන්ම නීරෝගීමත් අනාගතයක් වෙනුවෙන් ශිෂ්‍යයින් ක්‍රීඩා කටයුතුවල යෙදීම ඉතා වැදගත්ය.

දියුණු ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ තවත් වැදගත් සාධකයක් ලෙස නව නිර්මාණ හැඳින්විය හැක. බොහෝ ශිෂ්‍යයින් නව නිපැයුම් සඳහා යොමු වුවත් එම නිපැයුම් හුදෙක් ප්‍රදර්ශන භාණ්ඩ වලටම පමණක් සීමාවීම අභාග්‍යකි. එම නිර්මාණ වැඩි දියුණු කර වාණිජ මට්ටමින් වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ නිසි ක්‍රමවේදයක් හෝ මඟ පෙන්වීමක් නොමැති බැවින් එලෙස යටපත් වී යයි.

නිසි මූල්‍ය පරිපාලනයක් නොමැති බැවින් බොහෝ ආර්ථික ගැටළු වලට මුහුණපෑමට සිදුව ඇති අතර එය පුද්ගලයාගේ සිට සමස්ථ ආර්ථිකයම අවදානමට ලක්කර ඇත. බොහෝ දෙනා තම ආදායම නිසි පරිපාලනයකින් තොරව විවිධ අවශ්‍යතාවයන් වෙනුවෙන් වැයකරයි. අත්‍යාවශ්‍ය නොවන වියදම් සඳහා ද අනවශ්‍ය ආකාරයෙන් වියදම් කරමින් ගත කළ ජීවිත පසුගිය කොවිඩ් කාලසීමාව තුල දැඩි අවදානමට ලක්විය. බොහෝ පිරිස් ණය පහසුකම් පවා විදිනෙදා පරිභෝජනය සඳහා භාවිතා කරන නමුත්, ආයෝජන කෙරෙහි වැඩි නැඹුරුතාවක් නොදක්වයි.

ශිෂ්‍යයින් ලෙස අනාගතය වෙනුවෙන් වගකීමෙන් කටයුතු කලයුතු අවස්ථාවක් මේ වනවිට උදාවී ඇත. ආදායම් උත්පාදනය කරන වත්කම් පිළිබඳ වැඩි අවධානයක් යොමුකල යුතුය. කාලයත් සමග වටිනාකම වැඩි කරන සහ හොඳ ලාභාංශ ගෙවන සමාගම්, ආදායම් උපයන සහ කාලයත් සමග වටිනාකම වැඩි වන දේපල හා උද්ධමන අනුපාතයට වඩා වැඩි පොලී අනුපාතයක් ගෙවන ස්ථාවර ආදායම් ක්‍රම මත ආයෝජන කෙරෙහි නැඹුරුවිය යුතුය. නමුත් අයෝජන සඳහා යොමුවීමට මූලික ගැටළුවක් වනුයේ ප්‍රාග්ධන සම්පාදනයයි. ඒ සඳහා සුළු රැකියාවල යෙදීම හෝ බුද්ධිමය දේපල අලෙවිය භාවිතා කල හැක. ඒ සමග වියදම් අවම කිරීම සඳහා සුලුවෙන් හෝ ආහාර භෝග වගාව සිදුකල හැක. නව තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් නිසි පරිදි අපනයන වෙළෙඳපොල ඉලක්ක කරගනිමින් නිෂ්පාදන හඳුන්වා දීමට තරුණ ප්‍රජාවට හැකියාව ඇත. එමෙන්ම බොහෝ ශිෂ්‍යයින් සමාජ ජාල භාවිතයට යොමුවී ඇති බැවින් එම ක්‍රම භාවිතා කරමින් අවම පිරිවැයකින් නව අදායම් ක්‍රම විවෘත කරගත යුතුය.

යළි ගොඩනැගෙන අනාගතය වෙනුවෙන් ශිෂ්‍යයා මත වැඩි වගකීම් සමුදායක් පැවරී ඇත්තේ ඔවුන්ගේ අනාගතය කෙබඳු විය යුතුදැයි තීරණය කිරීම ඔවුන්ගේ ම තෝරාගැනීම් මත රඳා පැවතීමයි. එබැවින් ස්වයං විනයක් පවත්වා ගනිමින් මූලික ඒකකය වන පවුල තුල යහපත් බලපෑම් සිදුකරමින් නිවැරදි ගමන් මාර්ගය තෝරා ගැනීම ඔවුන්ගේ අරමුණ විය යුතුය.

ඉහත දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කලහොත් යළි ගොඩනැගෙන ශ්‍රී ලංකාව තුළ ශිෂ්‍යයා සිදු කළ යුතු කාර්යභාර්ය කුමක් ද යන වග ඔබට හඳුනාගත හැක.

**මූලාශ්‍ර**

https://srilanka.travel/SLTDA_documents/ASR%202019.pdf
https://sltda.gov.lk/storage/common_media/ASR%2020201015 41160295.pdf
https://www.bls.gov/emp/

උදාර කත්‍රිආරච්චි

# වසරක නොමැකෙන පියසටහන්...

2022/2023 පරිපාලන වර්ෂය සඳහා නව විධායක කමිටුව 2022/02/20 වන දින තේරී පත් වූ අතර නව විධායක කමිටුව පත් වී මාස 10 කට අධික කාල පරාසයක් තුළ පෙරමග සාමාජිකයන්ගේ නොපසුබට උත්සාහයේ සහ සහෝදරත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ශ්‍රමය, මූල්‍ය, ද්‍රව්‍යමය, බුද්ධිමය දායකත්වයෙන් ව්‍යාපෘති රාශියක් සිදුකරන ලදී. එම ව්‍යාපෘතියන් හි සාරාංශගත පෙළගැස්ම පහත පරිදි වේ.



## විදුහල්පති නිළ නිවස ප්‍රතිසංස්කරණය කිරීම



අප විද්‍යාලයේ නව විදුහල්පතිතුමියගේ ආගමනයත් සමග විදුහල්පති නිළ නිවස ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමේ සහ ශුද්ධ පවිත්‍ර කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වයෙන් එම ව්‍යාපෘතිය ඉතා සාර්ථක ලෙස නිම කිරීමට අප කණ්ඩායමට හැකිවිය. මෙහිදී විදුහල්පති නිළ නිවසේ මුළුතැන්ගෙයි සිවිලිම අලුතින් ඉදිකිරීම සහ මුළු නිවසේම තීන්ත ආලේප කිරීම සිදු කරන ලදී. එමෙන්ම නිළ නිවාසය ශුද්ධ පවිත්‍ර කිරීමට ශ්‍රම දායකත්වය සැපයීම ද අප දශක කණ්ඩායම මගින් සිදු කරන ලදී.

## පාසල සතු ශිෂ්‍ය භට (CADET CORPS) ඉඩමේ මායිම් වැට නැවත ඉදිකිරීම

ඇරැව්වල පාරේ පිහිටා ඇති පාසල සතු ශිෂ්‍ය භට (CADET CORPS) ඉඩමේ අබලන්ව තිබූ මායිම් වැට ප්‍රතිසංස්කරණය කිරීම සහ එම ඉඩමේ පහළ කොටසේ කම්බි වැට යකඩ කණු යොදා අලුතින් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කෙරුණි.



## පුස්තකාල පොත් ලැයිස්තුගත කිරීම

අප විද්‍යාලයීය පුස්තකාලයේ පොත් ලැයිස්තුගත කිරීමේ කටයුත්ත මෙම වසරේ මූලාරම්භයේදී සිදුවුණු අතර එම ව්‍යාපෘතිය සඳහා පෙරමග සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වය ලබා දීමට අප කණ්ඩායමට හැකිවිය.

## පාසල් ධජය ප්‍රතිනිර්මාණය කිරීම

රාහුල ධර්මපාල ක්‍රිකට් තරඟාවලිය සංවිධානය කිරීමට සමගාමීව පාසල් ධජය ඉතා ඉක්මනින් ප්‍රතිණිර්මාණය කිරීමේ අවශ්‍යතාවය පාසල තුල පැන නැගුනු අතර අප කණ්ඩායමේ මෙම වසරේ සිදු කරන ව්‍යාපෘතියක් වශයෙන් මෙම කටයුත්ත සිදු කර කඩිනමින් පාසලට භාර දීම සිදු කරන ලදී.



## පෙරමග අවුරුදු සුභ පැතුම් පත



අවුරුදු සුභ පැතුම් පතක් අප දශක කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන් හට පිරිනැමීම මගින් සාමාජිකයා හා පෙරමග

කණ්ඩායමෙහි ඇති සුහදත්වය වර්ධනය කර ගැනීමටත්, සාමාජික පවුල්වල අයට පෙරමග සුභපැතුම් එක්කිරීමටත් අපට මෙම වසරේ බක්මාසයේ දී අවස්ථාව උදාවුණි.

### සීඩා ගොඩනැගිල්ලේ අපිළිවෙලට ගොඩ ගසා තිබූ පෙළ පොත් වර්ගීකරණය සිදු කිරීම



සීඩා ගොඩනැගිල්ලේ තැන තැන ගොඩ ගසා තිබූ පෙළ පොත් ශ්‍රේණි වශයෙන් සහ විෂය වශයෙන් වර්ගීකරණය කර නිසි ස්ථානයක ක්‍රමානුකූලව ගබඩා කිරීමේ කටයුත්ත මෙම ව්‍යාපෘතිය හරහා සිදු කළ අතර, එය එලදායී ලෙස නිම කර එම පොත් පාසල වෙත නැවත භාර දීමට කටයුතු කරන ලදී.

### ප්‍රධාන මූලය උත්පාදන ව්‍යාපෘතිය වශයෙන් "අපි සැනසිල්ලේ" සංගීත ප්‍රසංගය පැවැත්වීම

පෙරමග දශක කණ්ඩායම මගින් සංවිධානය කළ ගෘහස්ත සංගීත ප්‍රසංගය මෙවර 9 වෙනි වරටත් ජාතික තරුණසේවා සභා ශාලා පරිශ්‍රය තුලදී ජූනි 04 වන දින WAYO සංගීත කණ්ඩායම හා ෆැලන් ඇන්ඩ්‍රියා, සේනානායක වේරලියද්ද සුසංයෝගයෙන් අති විශාල ප්‍රේක්ෂක පිරිසකගේ සහභාගීත්වයෙන්, අති සාර්ථකව පැවැත්වීමට පෙරමග අප කණ්ඩායමට හැකිවිය.



මෙහිදී සිදු වූ සුවිශේෂී සිදුවීම නම් ප්‍රසංගය පැවැත්වීමට දින කීපයකට ප්‍රථම සියලුම ප්‍රවේශ පත් අලෙවිකර අවසන් කිරීමටත්, තරුණසේවා සභා ඉතිහාසයේ වැඩිම ප්‍රේක්ෂක පිරිසක් ශාලාවට එක්රොක් කර ගැනීමටත් අපට හැකිවීමය. පෙරමග ශක්තිය නැවත නැවතත් සමාජගත කිරීමට අපට මෙම ප්‍රසංගය හරහා ද හැකියාව ලැබුණි. මෙම ව්‍යාපෘතියට සමගාමීව සමරු කලාපයක් ද නිකුත් කරන ලදි.

### පෙරමග දශක කණ්ඩායමේ 15 වන සංවත්සරය වෙනුවෙන් පිරිත් දේශනාවක් පැවැත්වීම

අප පෙරමග කණ්ඩායමේ 15 වන සංවත්සරය මෙම වසරේ වෙසක් පුන් පොහොය දිනයේදී යෙදී තිබුණු අතර, එම දිනය නිමිති කොටගෙන, පාසල් බුදු මැදුරේ දී සිදුකරන ලදී. මෙම පිරිත් දේශනාව ගරු විදුහල්පතිතුමිය, ආදි ශිෂ්‍ය සංගමයේ ගරු විධායක සභාපති ඇතුළු සාමාජිකයන්, දශක කණ්ඩායම් සභාපති ලේකම්වරු සහ අප කණ්ඩායමේ හිටපු සභාපති ලේකම්වරු ඇතුළු සාමාජිකයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි.

### පෙරමග ව්‍යාපෘතීන් පිළිබඳව පසු විපරම




පෙරමග දශක කණ්ඩායම විසින් පසුගිය වසර කිහිපය මුළුල්ලේ පාසලේ සුභ සිද්ධිය උදෙසා සාදා නිම කර දුන් ව්‍යාපෘති පසු අධීක්ෂණය සහ ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය හරහා සිදුකෙරුණි. මෙම ව්‍යාපෘතිය මගින් 6 - 9 ශ්‍රේණි සඳහා සාදා නිම කර දුන් වැසිකිළි පද්ධතිය අවට පිරිසිදු කිරීම සහ එම වැසිකිළි පද්ධතියේ ඇතුළත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම ද, හරිත ව්‍යාපෘතිය හරහා සියලුම මල්පැල නැවත අළුතින් සිටුවීම ද, කෞතුකාගාරය සහ ප්‍රවේශාගාරය පිරිසිදු කිරීම හා නඩත්තු කටයුතු ද සිදුකෙරුණි.

### අබලන් පුටු මේස අළුත්වැඩියාව

පාසලේ තැන තැන ගොඩ ගසා තිබූ අබලන් මේස පුටු පිළිසකර කර නැවත පාසලට භාර දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය හරහා අබලන් මේස 60ක ප්‍රමාණයකුත් පුටු 60ක ප්‍රමාණයකුත් අළුත්වැඩියා කර නැවත පාසැලට භාරදීමට මෙම වසරේදී පෙරමග කණ්ඩායමට හැකිවිය.



### පෙරමග Six a Side ක්‍රිකට් තරඟාවලිය

වසර 15 ක පෙරමග ඉතිහාසයේ අඛණ්ඩව 15 වන වරටත් පෙරමග සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 2022 අගෝස්තු 12 වන දින අති සාර්ථකව විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ දී පැවැත්වීමය. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස විද්‍යාලයේ විශ්‍රාමලත් ක්‍රීඩා භාර ආචාර්යවරුන් වන සරෝජා විමලසිරි ගුරු මැණියන්, සුසිල් ගුණවර්ධන ගුරු පියාණන් සහ ටී.කේ. පාලිත ගුරු පියාණන් සහභාගි විය.



මෙහිදී ඔවුන් විද්‍යාලයේ ක්‍රීඩා උන්නතියට සිදුකරන ලද අනුපමේය සේවය අගයනු වස් සමරු තිළිණ ද ප්‍රදානය කෙරිණි.

කණ්ඩායම් 21කගේ සහභාගීත්වයෙන් ඇරඹුණු තරඟාවලියේ මෙවර ශූරතාවය "අරංගල නවරැල්ල" කණ්ඩායම විසින් දිනාගන්නා ලද අතර, අනු ශූරතාවය Present Palians කණ්ඩායමට හිමි විය. ශූරතාවය හිමිකරගත් කණ්ඩායමට රු. 40,000 ක මුදල් ත්‍යාගයක් සහ අනුශූරතාවය සඳහා රු.25,000 ක මුදල් ත්‍යාගයක් පිරිනමන ලදී. හොඳම පිතිකරණය, හා හොඳම පන්දුයැවීම හා තරඟාවලියේ වීරයා යන අංශ සඳහා ද මුදල් ත්‍යාග ලබාදුනි. මෙවර තරඟාවලියේ ප්‍රධාන අනුග්‍රාහක දායකත්වය "නිමිතරු කන්ස්ට්‍රක්ෂන්" අධිපති සංජීව කාරියවසම් මහතා විසින් දරන ලදී. සාමාජික සුහදත්වය වර්ධනය කිරීම, නව සාමාජිකයන් එක් කර ගැනීම හා සාමාජිකයන් හට විනෝදාස්වාදය ලබාගැනීම යන අරමුණු පෙරදැරි කොට පවත්වන ලද මෙම තරගාවලිය ඉතාම සුහදව අති සාර්ථක අන්දමින් අවසන් කිරීමට පෙරමග දශක කණ්ඩායමට හැකි විය.

## පාසලට ක්‍රිකට් උපකරණ ලබා දීම





විද්‍යාලයේ පළමු පෙළ ක්‍රිකට් කණ්ඩායමට පරිහරණය සඳහා වටිනා ක්‍රීඩා උපකරණ ලබාදීම මේ යටතේ සිදුවිය. ඒ අනුව ක්‍රිකට් පිති 2 ක් සහ Thigh Pad 2 ක් පරිත්‍යාග කෙරිණි. මේ සඳහා සම්පූර්ණ අනුග්‍රහය දක්වන ලද්දේ ජ්‍යෙෂ්ඨ පෙරමග සාමාජිකයෙකු වන මහවත්තගේ රෝෂන මහතා ය. ආදි ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් ඒ මහතා දැක්වූ දායකත්වය පැසසිය යුතුම ය.

## සාමාජික ප්‍රවර්ධන වැඩසටහන

පෙරමගින් සිදුකරනු ලබන සියලුම ව්‍යාපෘතීන් වලදී පෙරමග Membership Hut සාමාජික ප්‍රවර්ධන වැඩසටහන සිදුකරන ලදී. කණ්ඩායමේ ප්‍රධාන වත්කම වන සාමාජිකයන් වැඩිකර ගැනීමට මේ හරහා අපට හැකිවිය.



## 2021 වර්ෂය සඳහා පැවති ධර්මපාල - රාහුල මහා ක්‍රිකට් තරගාවලිය සඳහා සහයෝගය ලබාදීම

2021 වර්ෂය සඳහා පැවැත්වුණු ධර්මපාල - රාහුල මහා ක්‍රිකට් තරගාවලිය සඳහා නන් අයුරින් සහයෝගය ලබා දීමට අප කණ්ඩායමට හැකි විය.

◆ ආහාර අලෙවි සැලක් සඳහා (Food Hut) සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

◆ තරගාවලියට අවශ්‍ය වූ DJ Music සඳහා රු. 20000/- ක මුදලක් පරිත්‍යාග කිරීම.

◆ තරඟාවලිය සඳහා අවශ්‍ය ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබාගැනීම උදෙසා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.



◆ තරගාවලියට ප්‍රථම සහ අවසානයේ කොඩිකණු සවිකිරීම සහ ඉවත් කිරීම සඳහා ද, කැනපි අදාල ස්ථානවල ස්ථානගත කිරීම සඳහා ද ශ්‍රම දායකත්වය සැපයීම.

◆ තරගාවලියට ප්‍රථම ආදි ශිෂ්‍ය කාර්යාලය අවට පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ශ්‍රම දායකත්වය සැපයීම.

## පෙරමගින් ආදි සිසු සෙවණට



අප පාසල උදෙසා සිදු කරනු ලබන සියලුම දායකත්වයන් ලබා දීමට එක් රොක් වන ආදි ශිෂ්‍ය කාර්යාල ශ්‍රවණාගාරයේ අබලන් තත්වයේ පැවති පුටු නැවත ප්‍රතිසංස්කරණය කර ආදි ශිෂ්‍යයන් හට රැස්වීම් පැවැත්වීමට හැකි සුවපහසු පරිසරයක් නිර්මාණය කර දීමට පෙරමග දශක කණ්ඩායමට හැකි විය.

## ලෝක ළමා දිනය වෙනුවෙන් පෙරමග දායකත්වය

ඔක්තෝම්බර් 1 වන දිනට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව අප විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ දරුවන්ගේ කලා කුසලතා වර්ධනයට සහ ඒකාකාරී අධ්‍යාපන රටාවෙන් මුදවාලීම අරමුණු කොටගෙන පෙරමග කණ්ඩායම විසින් චිත්‍ර තරගයක් පවත්වන ලදී. මෙම තරගාවලියේ තරග විනිශ්චය සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන්ගේ සහයෝගය ලැබුණු අතර ශ්‍රේණි මට්ටමින් 1/2/3 වශයෙන් ත්‍යාග 15ක් සහ කුසලතා සහතික 100 ක් අප ප්‍රාථමික අංශයේ දරු දැරියන් හට ලබාදීමට ලෝක ළමා දින වැඩසටහනේදී අපට හැකිවිය.



මීට අමතරව එදින ප්‍රාථමික අංශයේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අයිස්ක්‍රීම් බෙදා දීමට පෙරමග අප කණ්ඩායමට හැකිවීම සතුටට කරුණකි.

## Merchandise Pack




පසුගිය වසරේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මෙම වසරේ දී ලැබුණු ඇණවුම් වලට අනුව නිකුත් කරමින් සිදුකරගෙන යාමට අප කණ්ඩායමට හැකි විය.

## ගැහැණු ළමුන් සඳහා ක්‍රීඩා විවේකාගාරයක් ලබාදීම



අප පාසලේ ක්‍රීඩිකාවන් විශාල ජයග්‍රහණ රැසක් පසුගිය කාලය තුල දී ලබාගත් අතර මෙම ක්‍රීඩා හා සම්බන්ධ වනු ලබන ශිෂ්‍යාවන් සඳහා නියමිත ප්‍රමිතියකින් යුක්ත ක්‍රීඩා විවේකාගාරයක් නොමැති වීම හේතුවෙන් ඔවුන් බොහෝ අපහසුතා වලට මුහුණ දුන් අතර, එම ගැටළුව හඳුනාගත් පෙරමග කණ්ඩායම ගැහැණු ළමුන් සඳහා අවශ්‍ය අංග සම්පූර්ණ ක්‍රීඩා විවේකාගාරයක් තනා දීමට කටයුතු කරන ලදී. එම විවේකාගාරය ඔක්තෝම්බර් 20 වන දින උත්සවාකාරයෙන් පාසලට භාර දීමට හැකි විය.

## රම්‍ය දිය දහර

අප පාසලේ පවතින ප්‍රධානම අවශ්‍යතාවයක් වන පානීය ජල ගැටළුවට විසඳුමක් ලබා දීමේ අරමුණින් අප කණ්ඩායම මගින් ප්‍රාථමික අංශය සඳහා අළුතින් ජලනල පද්ධතියක් සකස් කිරීමට කටයුතු කළ අතර එමගින් ප්‍රාථමික අංශයේ දූ දරුවන්ගේ මූලික අවශ්‍යතාවයක් වන පානීය ජල අවශ්‍යතාවය සපුරා දීමට අපට හැකියාව ලැබුණි. මෙම ව්‍යාපෘතිය 2022 ඔක්තෝම්බර් 20 වන දින පාසල් පරිපාලනයට භාරදීම සිදුවුණි.

## විද්‍යාගාර සඳහා පෙරමග දායකත්වය

2019 / 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ එවකට විද්‍යාලයේ උසස් පෙළ විද්‍යාගාර සඳහා රසායන ද්‍රව්‍ය සහ විද්‍යා උපකරණ පරිත්‍යාග කරන ලදී.



එමගින් උසස් පෙළ විද්‍යා හා ගණිත අංශ වල ප්‍රතිඵල ඉහළ නැංවීම අපේක්ෂා කරන ලදී. ඒ අනුව යමින් මෙම වසරේ දී විදුහල්පතිතුමියගේ ඉල්ලීම පරිදි 6-11 විද්‍යාගාරය (ගල් ලැබ් එක) සඳහා රසායන ද්‍රව්‍ය, විද්‍යාගාර උපකරණ සහ වෙනත් පවිත්‍රකාරක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් විද්‍යා අංශයේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට ඉඩහසර ලබා දීම අපගේ ඒකායන අභිප්‍රාය යි.

## සෞඛ්‍යදාන ඒකකය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම



අප පාසලේ නියෝජ්‍ය විදුහල්පති කුකුලේවිතාන මහත්මියගේ ඉල්ලීම පරිදි විදුහල්පතිතුමියගේ නිර්දේශය මත පාසලේ සෞඛ්‍යදාන ඒකකයට හා සුව සෙවණට අවශ්‍ය කරනු ලබන ප්‍රථමාධාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අප පෙරමග කමිටු සාමාජිකයන්ගේ පරිත්‍යාගයෙන් ලබා දීමට හැකි වීම සියලු දෙනාගේ පැසසුමට ලක් විය.

## පෙරමග කැනපිය භාවිතයට ලබාදීම




අප විද්‍යාලයේ පැවැත්වූ උත්සව සඳහා සහ ආදි ශිෂ්‍ය කණ්ඩායම් වල විවිධ උත්සව සඳහා භාවිතා කිරීමට හා ප්‍රයෝජනයට ගැනීම උදෙසා පෙරමග කැනපිය ලබා දීම සිදුකරන ලදී. එමගින් විද්‍යාලයට හා ආදි ශිෂ්‍ය කණ්ඩායම් වලට තම ව්‍යාපෘතීන් සාර්ථක කර ගැනීම සඳහා පෙරමග දශක කණ්ඩායමට උපකාර කිරීමට හැකියාව ලැබුණි.

## පෙරමග පොකුර

පෙරමග දශක කණ්ඩායම සාමාජිකයන් 1100 කට අධික පිරිසකගෙන් සමන්විත වන අතර එම සාමාජිකයන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුත්ත පසුගිය වසර කිහිපය මුළුල්ලේ සිදුකෙරුණි. එමගින්, ඉදිරියේ දී සිදුකරනු ලබන පෙරමග ව්‍යාපෘතීන් වලදී එම ව්‍යාපෘතියන්හි ස්වභාවය

අනුව හරවත් ආකාරයෙන් අප සාමාජිකයන් පෙරමග දශක කණ්ඩායමට සම්බන්ධ කර ගැනීමට අපට හැකිවනු ඇත.



මෙම වර්ෂයේ දී මෙම ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ වලදී රැස්කර ගන්නා ලද සියලු දත්ත ක්‍රමානුකූලව පරිගණක ගත කොට පෙරමග පොකුර දත්ත ගබඩාව සකස් කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

## පෙරමග සඟරාව

පෙරමග කණ්ඩායම මගින් සඟරාවක් නිර්මාණය කර සාමාජිකයන් අතට පත් කිරීම සිව්වැනි වරටත් මෙම වසරේ දී සිදු කිරීමට අප කණ්ඩායමට හැකි විය. මෙමඟින් සාමාජිකයන්ගේ නිර්මාණ හා අදහස් වලට ඉඩහසර ලබා දීම මෙන්ම පෙරමග නාමය සමාජය තුළ සමාජගත කිරීමට ද අපි බලාපොරොත්තු වුණෙමු. මෙවර ද මෙම සඟරාව විද්‍යුත් සඟරාවක් (E-Magazine) ලෙස පෙරමග වෙබ් අඩවියට ඇතුලත් කර ඇත.




## පෙරමග සවිය

විදුහල්පතිතුමිය විසින් නිර්දේශ කරන ලද අඩු ආදායම් ලාභී පවුල් වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් එකොළොස් දෙනෙකු හට පසුගිය වසර වල පවත්වාගෙන පැමිණි ආකාරයටම ශිෂ්‍යාධාර දීමනාවක් මාසිකව ලබා දීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරනු ලබයි.

## ආදි ධර්මපාලයීය දැල්පන්දු සංගමයේ ලොතරැයි දිනුම් ඇදීම

ආදි ධර්මපාලයීය දැල්පන්දු සංගමය මගින් සංවිධානය කළ වාර්ෂික ලොතරැයි දිනුම් ඇදීමේ ව්‍යාපෘතිය සඳහා දායකත්වය සැපයීමට පෙරමග දශක කණ්ඩායමට හැකිවිය. එම කණ්ඩායම මගින් ලබා දුන් ටිකට් පොත් කිහිපය මිලදී ගනිමින් විධායක සභාවේ සාමාජිකයන් විසින් සහයෝගය දක්වන ලදී.

## T- Shirt ව්‍යාපෘතිය



සෑම වසරකම මෙන්ම පෙරමග දශක කණ්ඩායමේ අනන්‍යතාවය පිළිබිඹු වන අයුරින් සහ එම වර්ෂයේ ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියට ප්‍රවර්ධනයක් සිදුවන ආකාරයට නිර්මාණය කරනු ලබන පෙරමග T- Shirt මේ වසරේදී ද නැවුම් වර්ණ සංයෝජනයක් සමඟින් නිර්මාණය කෙරුණි.

## පෙරමග වෙබ් අඩවිය

https:/peramagadvp.org




පසුගිය වසර තුලදී නව වෙබ් ලිපිනයක් සමග යාවත්කාලීන කළ පෙරමග වෙබ් පිටුව මෙම වර්ෂය තුලදී සිදුකළ ප්‍රධාන ව්‍යාපෘතීන් ද ඇතුළත් කර යාවත්කාලීන කිරීම අප විධායක සභාවේ සංස්කාරකතුමාගේ මෙහෙයවීමෙන් සිදුකරන ලදී.

## ව්‍යවස්ථා සංශෝධනය

පෙරමග දශක කණ්ඩායමේ අරටුව පෙරමග ව්‍යවස්ථාවයි. අප කණ්ඩායම මෙතරම් ශක්තිමත්ව ඉදිරියට ගමන් කිරීමට මෙන්ම වැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් සංගමය සමඟ රඳවා තබා ගැනීමටත් හැකියාව ලැබී ඇත්තේ සැමට පොදුවේ බලපාන ප්‍රායෝගික කරුණු ඇතුළත් ශක්තිමත් ව්‍යවස්ථාවක් පැවතීම නිසාය. කාලානුරූපීව යම් යම් සංශෝධන ඇතුළත් කරමින් ව්‍යවස්ථාවේ සඳහන් කරුණු යාවත්කාලීන කිරීම අප සිදුකරනුයේ එම නිසාය. එසේ ව්‍යවස්ථා සංශෝධන කිරීමේ කමිටුවක් 14 වන මහා සභාවේදී යෝජනා කළ අතර මේ වන විට එම කමිටුව විසින් ඉතා සාර්ථකව ව්‍යවස්ථාවේ කරුණු සංශෝධනය කර ඇත. අද වන විට එම කරුණු කෙටුම්පත් කරමින් පවතී. මේ වසර තුලදී ද ව්‍යවස්ථා සංශෝධන කමිටු රැස්වීම් කිහිපයක් සිදු කළ අතර ඒ සඳහා, අවශ්‍ය කටයුතු සලසා දීමට දැක්වීමට අප කණ්ඩායමට හැකිවිය.

## Social Media පවත්වාගෙන යාම






පෙරමග නමින් Facebook, Instagram, Whatsapp, Viber යන අන්තර්ජාල සමාජ මාධ්‍ය පවත්වාගෙන යාම තුලින් පෙරමග නාමය සමාජ ගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. එහිදී පෙරමග දශක කණ්ඩායම සිදුකරන ව්‍යාපෘතීන් පිළිබඳ දැනුවත් කිරීම, පෙරමග සුභ පැතුම් එක් කිරීම, විවිධ පණිවිඩ සාමාජිකයන් හට දැනුම් දීම වැනි කටයුතු සිදුකරමින් පවතී.

## මහා ක්‍රිකට් තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායමට ලබාදුන් සංග්‍රහයට දායකත්වය සැපයීම

ධර්මපාල සහ රාහුල විද්‍යාල අතර පවත්වන මහා ක්‍රිකට් තරගය 2021 වසරේදී කොරෝනා වසංගතය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. එම නිසා එම තරගය මෙම වසරේ අගෝස්තු 28 දින (2022/08/28) පවත්වන ලදී. ධර්මපාල විද්‍යාලයීය ක්‍රීඩකයන් එම තරඟය ජයග්‍රහණය කිරීමට සමත් විය. එම ජයග්‍රහණය සැමරීමට හා කණ්ඩායමේ ක්‍රීඩකයන් දිරි

ගැන්වීමට 2022 ඔක්තෝම්බර් 21 වන දින Mercantile Cricket Association පරිශ්‍රය තුලදී ආදි ශිෂ්‍ය සංගමය විසින් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. ඒ සඳහා රු.15,000/- ක මුල්‍ය දායකත්වයක් අප කණ්ඩායම විසින් ලබාදුන් බව ඉතා සතුටින් සිහිපත් කරමු.

## පෙරමග ගබඩා කාමරය



පෙරමග දශක කණ්ඩායම විසින් සිදුකරනු ලබන ව්‍යාපෘති වලදී අවසානයේ දී ඉතිරි වන, නැවත භාවිතයට ගත හැකි ද්‍රව්‍ය හා භාණ්ඩ ගබඩා කිරීමට හා පෙරමග සතු වත්කම් ආරක්ෂිතව තබා ගැනීමට පසුගිය වසර තුළ ඉදිකළ පෙරමග ගබඩා කාමරය තුළ අලුතින් රාක්ක 02 ක් ඉදිකර වැඩි ඉඩ පහසුකම් එම කාමරය තුළ ඇති කිරීමට අපි මෙම වසර තුලදී කටයුතු කළෙමු.

## පාසලේ 82 වැනි සංවත්සරය



1940 දෙසැම්බර් 08 වන දින අනගාරික ධර්මපාලතුමා ට හිමි භූමියක් තුළ අප පාසල ආරම්භ විය. එදින සිට ගත් කළ 2022 දෙසැම්බර් 08 වන දිනට පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ආරම්භ කර වසර 82 ක් සපිරී ඇත. එම කරුණ නිමිති කර ගෙන මෙවර පෙරමග දශක කණ්ඩායම පහන් පින්කමක්, බෝධි පූජාවක් හා ධර්ම දේශනාවක් පැවැත්වූයේ විද්‍යාලයීය බුදු මැදුර තුලදීය. එම පින්කම සඳහා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිතුමා ඇතුළු ප්‍රධාන නිලධාරින්, දශක කණ්ඩායම් සභාපතිවරුන්, පෙරමග දශක කණ්ඩායමේ හිටපු සභාපතිවරුන් සහ ලේකම්වරුන්, අප කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් මෙන්ම මෙම වර්ෂයේ විධායක සභිකයින් සහභාගී විය.

## ප්‍රධාන ශාලාවේ ප්‍රවේශ දොරටුව සකස් කිරීම

විද්‍යාලයීය ප්‍රධාන ශාලාව නවීකරණය කිරීමේ කටයුත්තට සමගාමීව මීට වසර කීපයකට ඉහතදී පෙරමග විසින් අලුත්වැඩියා කළ ප්‍රවේශාගාරය හරහා ප්‍රධාන ශාලාවට පිවිසීමට ද්වාරයක් සකස් කරන ලදී. එය අඩි 10 කට ආසන්න උසකින් හා අඩි 5 කට ආසන්න පළලකින් යුක්තව සකසා තිබුණි. ඒ සඳහා පියන් දෙකකින් සමන්විත කොටු හැඩයේ කැටයමක් සහිත දොරක් සහ එම විශාල දොරවල් දෙක දැරීමට ශක්තිමත් විශාල උලුවස්සක් සකස් කර පින්තාරු කර, සවිකර පාසලට දායාද කිරීමට අපට හැකිවිය.



## විද්‍යාලයීය ක්‍රීඩාගාරය අලුත්වැඩියා කිරීම

පෙරමග දශක කණ්ඩායම විසින් මෙම වසරේ දී සිදු කිරීමට යෝජනා කර තිබූ විද්‍යාලයීය ක්‍රීඩාගාරය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලාරම්භයේ දී ආදි ශිෂ්‍ය සංගමයේ අවසරය නොලැබුන නමුත්, පසු කාලයේ දී විදුහල්පතිතුමියගේ සහ ආදි ශිෂ්‍ය සංගමයේ අවසරය ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අප කණ්ඩායමට හැකි විය. මෙම ව්‍යාපෘතියට අදාල භූමියේ සැලසුම්, 3D සැලසුම් සහ ව්‍යාපෘති ඇස්තමේන්තුගත කිරීම වැනි මූලික කටයුතු මේ වන විටත් අවසන් කර ඇත.



## පෙරමග පසු විපරම 2

මෙම ව්‍යාපෘතිය යටතේ ගණිතාගාරයේ පිටත බිත්ති වල අලංකාරය සඳහා සවිකර තිබූ පුවරු අලුත්වැඩියා කිරීම සහ 10-11 ශ්‍රේණිවල පිරිමි ළමුන්ගේ වැසිකිළි අවට පිරිසිදු කිරීම සහ කවුළු වල තීන්ත ආලේප කිරීම සිදු කළෙමු.



## පෙරමග සමාජ මෙහෙවර

**(අධිකරණ අමාත්‍යංශය හා ප්‍රා.ලේකම් කාර්යාලය එක්ව සිදු කළ අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා අප පාසලේ දරුවන් සම්බන්ධීකරණය කිරීම**



මෙම ව්‍යාපෘතිය හරහා අප පාසල මගින් තෝරා අප වෙත ලබාදුන් මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි අඩු ආදායම්

ලාභී පවුල්වල දරුවන් 13 දෙනෙකුට පාසල් බෑග්, පොත් පත්, පෑන් පැන්සල් සහ සපත්තු වලින් සමන්විත පාසල් උපකරණ කට්ටලයක් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතියට අදාල සියලුම සම්බන්ධීරණ කටයුතු සිදුකිරීමට අප කණ්ඩායමට හැකිවිය. මෙම සත්කාරය සඳහා සම්බන්ධීකරණය සිදුකළේ පෙරමග සාමාජික දිලුෂි ශෂිකලා සොයුරියයි.

### පෙරමග සුහද හමුව




පෙරමග සාමාජික ප්‍රවර්ධනය හා සාමාජික සුහදත්වය වර්ධනය කිරීම සඳහා මෙම හමුව සංවිධානය කිරීමට අප බලාපොරොත්තු වෙමු. මෙවර විධායක සභාවේ තීරණය අනුව අප ජීවත් වන පරිසරයෙන් තරමක් ඈතින් පිහිටි නිස්කලංක පරිසරයක් තුල දිවා කාලයම තම පවුලේ සියලුම සාමාජිකයන් හා පෙරමග මිතුරන් සමග සතුටින් කාලය ගත කළ හැකි හෝටල් පරිශ්‍රයක් තෝරා ගැනීම සිදුවිය. එපමණක් නොව තවත් විශේෂාංග රාශියක් සමඟ විනෝද ක්‍රීඩාවන්ගෙන් සමන්විත සංගීතමය රසාස්වාදයෙන් පිරීපුන් දිනක් ගතකිරීමට 2023 වර්ෂයේ ජනවාරි මස 22 ඉරු දින දී සාමාජිකයන් එක් රොක් කර ගනිමින් මෙවර සුහද හමුව සංවිධානය කර ඇත.

### පාසල් සිතියම යාවත්කාලීන කිරීම

ඉතා විශාල භූමි ප්‍රදේශයක විහිදී තිබෙන අප පාසල් සංකීර්ණය තුළ ඇති ස්ථාන ආගන්තුකයෙකුට එකවරම හඳුනාගැනීම අපහසුය. මේ හේතුවෙන් 2008 A/L ශිෂ්‍ය නායක බණ්ඩය 2005 වසරේදී ඔවුන් පාසල් ශිෂ්‍යයන්ව සිටි සමයේදී මෙම ව්‍යාපෘතිය සිදුකරන ලදී. මෙම පාසල් සිතියම අද වන විට යල් පැන ගොස් ඇත. එදා පාසලේ ශිෂ්‍යයන්ව සිටි අද පෙරමග සාමාජිකයන් වන 2008 A/L ශිෂ්‍ය නායකයන්ගේ දායකත්වයෙන් යාවත්කාලීන කළ පාසල් සිතියම නවමු ආකාරයෙන් පාසල තුළ ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වෙමු. මෙය පාසලේ ප්‍රධාන ගේට්ටුව අසල ආදි ශිෂ්‍ය කාර්යාලයේ පිවිසිම අසල ස්ථාපිත කිරීමට නියමිතය.




### පාසල් කෞතුකාගාරය අධිලේඛණාගාරයක් කිරීම

පෙරමග විසින් 2019 වසරේ දී සාදා නිම කර පාසලට භාරදුන් පෙරමග කෞතුකාගාරය, අධිලේඛණාගාරයක් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ පිඹුරුපත් සකස් කර වැඩ කටයුතු ආරම්භ කළ අතර එය මෙම පරිපාලන වර්ෂයේ අග භාගයේ අවසන් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.



### සියසර බක්මහ උළෙල සඳහා පෙරමග දායකත්වය ලබාදීම

සියසර දශක කණ්ඩායම මගින් වාර්ෂිකව පවත්වනු ලබන සියසර බක්මහ උළලේ අවුරුදු කුමරා සහ කුමරිය සඳහා ත්‍යාග ලෙස අප කණ්ඩායම මගින් නිර්මාණය කරන ලද VIP Gents Merch Pack & VIP Ladies Merch Pack දෙකක් එම කණ්ඩායම සඳහා ලබා දෙමින් අනුග්‍රහය දැක්වුයෙමු.

### පාසලේ ක්‍රීඩා ජයග්‍රහණ පුවරු ප්‍රදර්ශනය කිරීම

පාසලේ ක්‍රීඩා අංශයේ ජයග්‍රහණයන් ලබා පාසලට කීර්තියක් අත් කරදුන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇගයීම සඳහා ඔවුන්ගේ ජයග්‍රහණ හා ඒ පිළබඳ විස්තර ඇතුලත් ප්‍රචාරණ පුවරු සවිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබා දීම.




### සහතික පත්‍ර මුද්‍රණය සඳහා මුදල් ආධාර ලබාදීම

අප විද්‍යාලයේ ක්‍රීඩා හා විෂය සමගාමී සංගම් වල සිසු සිසුවියන්ට ලබාදීම සඳහා අවශ්‍ය සහතික පත්‍ර මුද්‍රණයට මුල්‍යමය දායකත්වය ලබා දීම.

### පෙරමග Youtube චැනලය පවත්වාගෙන යාම

පෙරමගින් සිදු කරන සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල කෙටි විඩියෝ පට ප්‍රචාරණය කිරීම හා පෙරමග සන්නාමය සමාජගත කිරීමට මෙම වැඩසටහන් හරහා අපි බලාපොරොත්තු වෙමු. තවද පෙරමග කීර්තිමත් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සම්මුඛ සාකච්ඡා සමාජගත කිරීම මගින් ධර්මපාල විද්‍යාලයීය නාමය ඉහළින් ඔසවා තැබීමට අප අපේක්ෂා කරමු.




**චමිඳු විජයවර්ධන / තිළිණි ශ්‍යාලිකා තිලකරත්න**

M-021

විමංෂා ජ්‍යොතිෂ්‍ය සේවය



- කේන්ද්‍ර සෑදීම
- පලාඵල කථනය
- නැකත් සෑදීම
- වාස්තු දෝෂ පරීක්ෂාව
- අභියාචනා සැකසීම
- අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව සහ විමර්ශන අංශ වෙත යොමුකල යුතු මුදල් හා දේපල වංචාවන්ට අදාල මූලික පැමිණිලි සකස් කර දීම

ජ්‍යොතීර්වේදී / සේවාර්ජිත පොලිස් පරීක්ෂක
ඩබ්.ඒ. බාලසූරිය
B.A.(SP) (USJ), PG Dip in Criminology (USJ)
Certificate Course of VastuVidya (University of Kelaniya)

191/A/1, 10, පටුමග, පැපිලිවල පාර, බ්‍රාහ්මනගම, පන්නිපිටිය
Whatsapp: 0702429543

M-029

සියල් සපිරි - විල්පත්තු නේචර් රිසෝට්

01. කලා ඔයේ දූපත්වල දිය නෑම.
02. කල්පිටි දූපත්වල අසිරිය නැරඹීම.
03. කල්පිටිය සිංහ එරමතිව් දූපතට දිවා / රාත්‍රී ප්‍රවේශ වීම. (Camping)
04. ඩොල්ෆින් නැරඹීමට බෝට්ටු සවාරි
05. සංචාරකයින් සඳහා බෝට්ටු සවාරි
06. විල්පත්තු සෆාරි
07. ගඟ අද්දර රාත්‍රී ගිනිමැල සමඟ Three Piece සංගීත කණ්ඩායම හා සංගීත රාත්‍රිය
08. Night Camping
09. පිහිනුම් තටාක
10. දේශන ශාලා පහසුකම්



රාත්‍රී නවාතැන් පහසුකම් - 40 දෙනෙකු සඳහා

Samagi Hotels & Travels (Pvt) Ltd
No. 1/56, Chilaw Road, Wennappuwa.
Tel: 031 22 55 970 / 031 22 53172
Hotline / WhatsApp : 077 3085 966 / 070 2849 345
Email- samagi.group@yahoo.com

SAMAGI GROUP

M-012

THISARU LANKA CHEMICAL TECHNOLOGY (PVT) LTD.

We offer analytical, inspection and consultancy Solution for our Customers to help them Streamline Processes, enhance productivity, reach compliance with regulatory requirments or optimize cost



No: 99/75 B, Ivory Garden, Old D.R.O Road, Kandana.
Tel: +94 112 098 332 / +94 773 874 332
Email: info@thisarulanka.lk

M-013

HASINDU FASHION

*Ladies men's & kids tailored clothing in any style "you need at one place"*

Made in Sri Lanka



No: 205/B, Artigala Road, Wataraka, Padukka.
Tel: 0719039297 hasindufasion@gmail.com

# සෞන්දර්යයෙන් ඔපවත් වූ දම්පල් මිණි කැට...



## නර්තන අංශය
**එස්. එන්. ඩිල්ශානි පබසරා රූපතිලක**
**13 ශ්‍රේණිය**

- 2011 වර්ෂයේ සිට පාසල් නර්තන කණ්ඩායම නියෝජනය කිරීම.
- 2016 වර්ෂයේ ශීර්ෂාභරණ පැලඳවීම.
- 2017 පෙරදිග තූර්ය වාදන කණ්ඩායමට ඇතුල් වීම.
- 2018 ගුංගුරු පැලඳවීමේ මංගල්‍යය.
- 2020 - 2023 පෙරදිග තූර්ය වාදන කණ්ඩායමේ නායකත්වය දැරීම.

**ජයග්‍රහණ - කලාප තරග**

- පහතරට සමූහ ගෙජ්ජි මාත්‍රය (ප්‍රථම ස්ථානය - 2022)
- ඒකල මඟුල් බෙර වාදනය. (පහතරට ප්‍රථම ස්ථානය - 2022)



## නර්තන අංශය
**ඩබ්. පී. ප්‍රතාප් ප්‍රජේෂ්වර**
**12 ශ්‍රේණිය**

- 2012 සිට නර්තන කණ්ඩායම නියෝජනය කිරීම.
- 2016 මඩු බැසීම. (පහතරට)
- 2017 හිස වෙස් හා ශීර්ෂාභරණ පැළඳවීම.
- 2017 සිට දම්පල් නර්තන සංසදය සංවිධායක කමිටුව නියෝජනය කිරීම.
- 2017 සිට හේවිසි කණ්ඩායම නියෝජනය කිරීම.

**ජයග්‍රහණ - කලාප තරග**

- ගොප්කොළ කැටයම් නිර්මාණය. (ප්‍රථම ස්ථානය - 2022)
- අභ්‍යබෙර වාදනය (සභය තාලම්පට වාදනය. ප්‍රථම ස්ථානය - 2022)
- පහතරට සමූහ ගෙජ්ජි මාත්‍රය. (ප්‍රථම ස්ථානය - 2022)



## සංගීත අංශය
**ඩී.එල්. සෙනුද දිල්සර අමරවික්‍රම**

- 2019 සමස්ත ලංකා කනිෂ්ඨ බටහිර තූර්ය වාදක තරගයේ තෙවන ස්ථානය.
- 2019 කනිෂ්ඨ පළාත් බටහිර තූර්ය වාදක කණ්ඩායම් තරගයේ ප්‍රථම ස්ථානය.
- 2019 සමස්ත ලංකා තරගාවලියේ ප්‍රථම ස්ථානය. (සංගීතය)
- Interact සංගමයේ ස්වර නදී උත්සවය සංවිධානය කිරීම.
- 2018 වර්ෂයේ සමස්ත ලංකා 2 වන ස්ථානය. (Western Boys Band) (Mixed Instrumental)
- 2018 වර්ෂයේ කලා උළෙලේ පද්‍ය ගායන හා පද්‍ය රචනා ප්‍රථම ස්ථානය.
- 2019 වර්ෂයේ රාජ්‍ය සම්මාන උළෙල සඳහා නිර්දේශ වීම. (හොඳම ළමා ගීත)
- 2022 වර්ෂයේ භාත්කණ්ඩේ විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවන සංගීත විශාරද උපාධිය ලබාගැනීම.



## සංගීත අංශය
**ඩබ්.ආර්.ඒ.ඩී. මෙත්ලි ගීමන්ති රාජපක්ෂ**

- 2018 - සිංහල භාෂා දිනය පද්‍ය ගායනා - දෙවන ස්ථානය. (8 ශ්‍රේණිය)
- 2019 - සිංහල භාෂා දිනය පද්‍ය ගායනා - ප්‍රථම ස්ථානය. (9 ශ්‍රේණිය)
- 2020 - සිංහල භාෂා දිනය පද්‍ය ගායනා - ප්‍රථම ස්ථානය. (10 ශ්‍රේණිය)
- ඒකල ගැහැණු පහතරට ලලිතරාග තාලය ශීර්ෂය යටතේ (ගායනය) හා සමස්ත ලංකා ප්‍රථම ස්ථානය 2018.
- වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2016 ත්‍යාගය පෙරදිග සංගීත විෂය සඳහා.
- වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2017 ත්‍යාගය පෙරදිග සංගීත විෂය සඳහා.
- 2017 සුමිසන් සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය නිවේදන අංශය - ප්‍රථම ස්ථානය.
- 2018 සමර්පණ සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය නිවේදන අංශය - තෙවන ස්ථානය.



## නාට්‍ය හා රංග කලාව
**අනුහස් සුපුන්සර රොද්‍රිගු**
**11 ශ්‍රේණිය**

- ලෝක ළමා දින නාට්‍ය ඉදිරිපත් කිරීම.
- බාල දක්ෂයන් සමග කටයුතු කිරීම. (කැබෝරි සඳහා සහභාගී වීම.)
- ධර්මපාල විද්‍යාලයීය නාට්‍ය සංගමය නියෝජනය කිරීම.
- රංගන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග කටයුතු කිරීම.
- පරිසර සංගමයේ සාමාජිකත්වය දැරීම.
- අංගාරා ගඟ ගලා බසී නාට්‍ය රඟ දැක්වීම. (රංජිත් ධර්මකීර්ති මහතාගේ)
- වෙළඳ දැන්වීම් වලට සම්බන්ධ වීම.



## නාට්‍ය හා රංග කලාව
**ඒ. එම්. බුවනි ඩිෂ්ණිකා අත්තනායක**
**11 ශ්‍රේණිය**

- ලෝක ළමා දින නාට්‍ය ඉදිරිපත් කිරීම.
- ලියෝ elation අංශයේ නර්තනාංගය.
- විද්‍යාලයීය නාට්‍ය සංගමයේ සාමාජිකත්වය දැරීම.
- ධර්මපාලීය ලියෝ සංගමයේ සාමාජිකත්වය දැරීම.
- විද්‍යාලයීය සිංහල සාහිත්‍ය සංගමයේ සාමාජිකත්වය දැරීම.
- විවාද තරග ජයග්‍රහණ හා කථික තරග ජයග්‍රහණ ලබා ගැනීම.



## බටහිර සංගීතය
**ඩබ්. ජී. මෙවන් හරිඳු හිම්සර**

- 2020 ලෝක ළමා දින වැඩසටහනට සහභාගී වීම.
- 2022 භක්ති ගීත සඳහා සහභාගී වීම.
- ස්වර්නදී 2022 (Interact Club) කලා උළෙලට සහභාගී වීම.
- බටහිර සංගීත විෂය සඳහා ත්‍යාග ලබා ගැනීම 2017, 2020 සහ 2021 වර්ෂ සඳහා



## චිත්‍ර අංශය
**ඒ. ලෝචන යසිත්**
**12 ශ්‍රේණිය**

- 2022 සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගයේ කලාප මට්ටමට තේරී ඇත.
- 2022 පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ සෙනරත් පරණවිතාන දීප ව්‍යාප්ත චිත්‍ර තරගය - ප්‍රථම ස්ථානය
- 2022 සෝලියස් මෙන්ඩිස් අනුස්මරණ දීප ව්‍යාප්ත පාසල් චිත්‍ර තරගය - කුසලතා සහතික දිනා ගැනීම.
- 2022 Asia Pacific Regional Ozone 2 Climate Art Competition Certificate of Participation



### ප්‍රණාමය

නර්තනය - එම්.ඒ.එස්.පුශ්පකුමාරි මිය
- නලින්ද අංගේකුඹුර මයා
පෙරදිග සංගීතය - එස්.ඩී. කොල්ලුරගේ මිය
බටහිර සංගීතය - ජීවන්ති අභාවුද මිය
නාට්‍ය හා රංග කලාව - යූ.එච්.තරංගනී නිලූකා මිය
චිත්‍ර - ප්‍රියන්ත ගුණසේකර මයා
- ඩබ්.කේ.එන්.ප්‍රීතිකා තිලකරත්න මිය

දිනේෂා ජයමාන්න

# දම්පල් දූ පුතුන්ගේ ක්‍රීඩා කුසලතා

ක්‍රීඩා පර්පාලක : මාලනී යටවර මිය
මලල ක්‍රීඩා භාර/ මලල ක්‍රීඩා පුහුණුකරු/ සෞඛ්‍ය හා ශාරීරික විෂය භාර : දුලිප් දුෂ්මන්ත පෙරේරා මයා

## මලල ක්‍රීඩා

### සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා ශූරතාවලිය - 2022

අවුරුදු 20න් පහළ බාලිකා උස පැනීම ප්‍රථම ස්ථානය (රන් පදක්කම) රනින්දි පෙහන්සා දිනා ගෙන ඇත. බස්නාහිර පළාත් තරගාවලියේ දී ඇය විසින් මෙම ඉසව්ව සඳහා 1.67m දක්ෂතාවයක් පෙන්වමින් නව තරග වාර්තාවක් පිහිටුවා ඇත.

අවුරුදු 20 න් පහළ බාලිකා 100m x 4 සහය දිවීම ඉසව්ව තත්පර 48.98ක නව තරග වාර්තාවක් තබමින් නිලුමින්දි යාපා, හිරුණි අංජලී, බෙත්මී ප්‍රබෝධා සහ ටානියා ගන්ධාරි විසින් ප්‍රථම ස්ථානය දිනා ඇත.

බස්නාහිර පළාත් මලල ක්‍රීඩා තරගාවලියේ දී අවුරුදු අවුරුදු 20 න් පහළ බාලක 100m ප්‍රථම ස්ථානය (තත්පර 10.8 වාර්තාව සම කිරීම) තරූෂ සත්සර විසින් ජයග්‍රහණය කර ඇත.

අවුරුදු 20 න් පහළ බාලිකා මීටර් 400m කඩුලු මතින් දිවීමේ ඉසව්වෙන් 3 වන ස්ථානය නිලුමින්දි යාපා විසින් ජයග්‍රහණය කර ඇත. බස්නාහිර පළාත් තරගාවලියේ දී ඇය විසින් මෙම ඉසව්ව තත්පර 64.8 කින් නිම කර නව තරග වාර්තාවක් පිහිටුවා ඇත.

## ජිම්නාස්ටික්

### සමස්ත ලංකා ජිම්නාස්ටික් තරගාවලිය - 2022

- මනුක තෙහාන් රාජපක්ෂ - දෙවන ස්ථානය (16 න් පහළ Pormmel Horse)
- තුෂාල් රොෂාන් - තුන්වන ස්ථානය (16 න් පහළ Parallel Bar)
- පසන් මදුහාන් - ප්‍රථම ස්ථානය (18 න් පහළ Pormmel Horse)
- කවිනු වෙනුරක - දෙවන ස්ථානය (18 න් පහළ Pormmel Horse)
- රපිඳු රණසිංහ - තුන්වන ස්ථානය (18 න් පහළ Romen Rings)

### ටයිකොන්ඩෝ සමස්ත ලංකා ජිම්නාස්ටික් තරගාවලිය -2022

- චුෂාදි කෞශල්‍යා - රන් පදක්කම
- හෙසන්‍යා වැලිකල - රන් පදක්කම
- හිරුෂි චමෝදි - රන් පදක්කම
- 20න් පහළ බාලිකා ශූරතාව හා සමස්ත බාලිකා අනු ශූරතාව ජයග්‍රහණය කර ඇත.
- සමස්ත ලංකා ඇරොබික් ජිම්නාස්ටික් තරගාවලියේ දෙවන ස්ථානය හෙසන්‍යා වැලිකල විසින් ජයග්‍රහණය කර ඇත.


# 2021 විද්‍යාලයීය අ.පො.ස උසස් පෙළ සමත් ප්‍රතිඵලය [ප්‍රථම වරට පෙනී සිටීම]

**කලා අංශය**
පෙනී සිටි සංඛ්‍යාව 127
විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලත් සංඛ්‍යාව 113

**තාක්ෂණ අංශය**
පෙනී සිටි සංඛ්‍යාව 47
විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලත් සංඛ්‍යාව 37

**වාණිජ අංශය**
පෙනී සිටි සංඛ්‍යාව 145
විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලත් සංඛ්‍යාව 126

**විද්‍යා හා ගණිත අංශය**
පෙනී සිටි සංඛ්‍යාව 138
විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලත් සංඛ්‍යාව 66



විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලත් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස

## ප්‍රණාමය

නියෝජ්‍ය විදුහල්පතිනි (අධ්‍යාපන පර්පාලන) - පී.ජී.එච්. හේරත් මිය
සහකාර විදුහල්පතිනි (අධ්‍යාපන පර්පාලන) - කුමුදු වික්‍රමසේකර මිය

දිනේෂා ජයමාන්න



# රම්‍ය දියදහර ව්‍යාපෘතිය



**පාසලේ පවතින ජල ගැටළුවට ස්ථිර විසඳුමක් ලබාදීම.**

**මිනිසාගේ** මූලික අවශ්‍යතා අතර ප්‍රධාන තැනක් පානීය ජලය සඳහා හිමි වේ. එහෙත් අප පාසල තුළ නිසි ක්‍රමවත් භාවයකින් පානීය ජලය නොලැබීම නිසා සිසු දරු දැරියන් මෙන්ම ගුරු භවතුන්ද අපහසුතාවයට පත් වූ අවස්ථා බොහෝය. මේ අතරින් ප්‍රාථමික අංශයේ කුඩා දරු දැරියන්ගේ පානීය ජල අවශ්‍යතා හා සනීපාරක්ෂක අවශ්‍යතා ප්‍රධාන තැනක් ගනී.

"පෙරමග" ලෙස අප, පාසලේ දරු දැරියන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම වෙනුවෙන් සෑම වසරකදීම පාසල තුළ විවිධ ව්‍යාපෘතීන් සිදු කරන ලදී. මෙම වසරේදී ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස ප්‍රාථමික අංශයේ ජල ගැටළුව නිරාකරණය කිරීම සඳහා 'රම්‍ය දිය දහර' ව්‍යාපෘතිය 2022/2023 පෙරමග විධායක කමිටුව මගින් ආරම්භ කරන ලදී.

අප විධායක කමිටුවේ විශේෂඥ සම්පත්දායක සමාජිකයන්ගේ දායකත්වයෙන් ම අදාළ සැළසුම් හා ඇස්තමේන්තු සකස් කරගැනීමෙන් පසු 2022-06-30 වන දින විදුහල්පතිතුමියගේ සහ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ විය.

## ව්‍යාපෘති වපසරිය

ව්‍යාපෘති පළමු අදියර
පළමු කොටස

- 1 ශ්‍රේණියේ පන්ති කාමර සඳහා ජල සැපයුම ලබා දීම.
- 2 ශ්‍රේණියේ පන්ති කාමර සඳහා ජල සැපයුම ලබා දීම.
- විශේෂ අවශ්‍යතා ඒකකයට ජල සැපයුම ලබා දීම.
- ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුලට ජල සැපයුම ලබා දීම.
- යෝජිත නව ශ්‍රවනාගාර භූමියට ජල සැපයුම ලබා දීම.

ව්‍යාපෘති පළමු අදියර
දෙවන කොටස

- ප්‍රාථමික අංශයේ වැසිකිළි පද්ධතියට ජල සැපයුම ලබා දීම.
- ප්‍රාථමික අංශයේ පුස්තකාලයට ජල සැපයුම ලබා දීම.
- ප්‍රාථමික අංශයේ සුව සෙවනට ජල සැපයුම ලබා දීම.
- 3 ශ්‍රේණියේ පන්ති කාමර සඳහා ජල සැපයුම ලබා දීම.
- ප්‍රාථමික අංශයේ ජල ටැංකිය පිරිසිදු කිරීම.
- ජල ගබඩා ටැංකියේ ජල සැපයුම් නල මාර්ග අලුතින් ඉදිකිරීම.









## ■ ව්‍යාපෘති වපසරිය

### ව්‍යාපෘති දෙවන අදියර - පළමු කොටස

- 4 ශ්‍රේණියේ පන්ති කාමර සඳහා ජල සැපයුම ලබා දීම.
- 5 ශ්‍රේණියේ පන්ති කාමර සඳහා ජල සැපයුම ලබාදීම.
- ප්‍රාථමික අංශයේ කාර්යාලයට ජල සැපයුම ලබාදීම.
- නල මාර්ග බෙදෙන ස්ථාන වලට ජල නැවැත්වීමේ කරාම යෙදීම.

### ව්‍යාපෘති දෙවන අදියර- දෙවන කොටස

- ගැහැණු ළමුන්ගේ (10-11 ශ්‍රේණිය) වැසිකිළියට ජල සැපයුම ලබාදීම.
- පිරිමි ළමුන්ගේ (10-11 ශ්‍රේණිය) වැසිකිළියට ජල සැපයුම ලබාදීම.
- ප්‍රාථමික අංශය තුළ එළිමහනේ සවිකර ඇති දෑත් සෝදන ස්ථාන සඳහා ජල සැපයුම ලබාදීම.
- පුස්තකාලය අසල ජල ටැංකිය පිරිසිදු කිරීම.
- ජල ගබඩා ටැංකියේ ජල සැපයුම් නල මාර්ග අලුතින් ඉදිකිරීම.

මෙහි සියලු කාර්යයන් නිම කර අලුත්ම ජල නල පද්ධතියක් එක්කර ප්‍රාථමික අංශයේ ජල ගැටළු වලට විසඳුම් ලබා දෙමින් රම්‍ය දිය දහර ව්‍යාපෘතිය 2022-10-20 වන දින සියලුම දෙනාගේ සහභාගීත්වයෙන් යුතුව උත්සවාකාරයෙන් දම්පල් සිසු දරු දැරියන් වෙත දායාද කිරීමට ලැබීම අප ලද මහත් භාග්‍යයකි.

ගයානි කොස්වත්තගේ

## ඔබේ දරුවාගේ පිපාසය නිවන්නට

පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් පෙරමග විසින් සිදුකරන මෙවැනි ව්‍යාපෘතීන් සඳහා ඔබටද දායකත්වය ලබා දිය හැක.

## කොහොමද ?

ඔබ ලබා දෙන මූල්‍යමය දායකත්වයන් පෙරමග දශක කණ්ඩායමේ පහත ගිණුම් වෙත බැර කළ හැක.

| | |
|---|---|
| Bank | : Commercial Bank |
| Branch | : Kottawa |
| A/C No | : 112-101-8333 |
| Acc. Name | : Peramaga Group Past Pupils Association, Dharmapala Vidyalaya Pannipitiya |
| Bank | : Sampath Bank |
| Branch | : Kottawa |
| A/C No | : 105-261-000-164 |
| Acc. Name | : Peramaga Group Dharmapala Vidyalaya Pannipitiya |
| Bank | : Peoples Bank |
| Branch | : Maharagama |
| A/C No | : 306-2-002-4-0001585 |
| Acc. Name | : Peramaga Kandayama Dharmapala Vidyalaya Old Boys Group |

වැඩි විස්තර සඳහා අමතන්න - 075 - 1 260 608/ 077 - 7 541 918
සාරංග පීරිස් (භාණ්ඩාගාරික)

# පෙරමග

**දශක කණ්ඩායම තුළ දෙවතාවක් ලේකම් ධුරය හා 2013 - 2014 වසර සභාපති ධුරය දැරූ පෙරමග ආරම්භක නියමුවකු වන අප සංගමයේ පළමුවන ලේකම් ධුරය හෙබවූ සනත් ලසන්ත සොයුරා හමුවීමට අපි ගියේ සුපුරුදු ලෙන්ගතු කම පෙර දැරිවයි.**




# "අපට තිබූ විශාලම ශක්තිය තමයි අපගේ සාමාජික සාමාජිකාවන් "

## - සනත් ලසන්ත පෙරේරා

**01) එදා දුටු සුන්දර සිනහව අදත් මුව රඳවාගෙන සිටි ඔහු පිලිසඳර ආරම්භ කරමින් අපි මුලින්ම අසා සිටියේ තම නිජ භූමිය වූ පන්නිපිටිය නගර මධ්‍යයේම තම ව්‍යාපාර කටයුතු දියත් කිරීමට ලැබීම හා ව්‍යාපාරික තත්ත්වය පිළිබඳවයි.**

අවුරුදු 21 ක් පමණ කෙමෙන් කෙමන් දියුණු කළ ව්‍යාපාරය අද වන විට පවතින තත්ත්වය පිළිබඳව මම පෞද්ගලිකව සතුටු වෙනවා.
වෙළඳ ප්‍රචාරණය කියන්නේම එදිනෙදා වෙනස් වන ක්ෂේත්‍රයක්. එය දිනෙන් දින නව්‍යකරණය නොවී නිසි පැවැත්මක් නැහැ. ව්‍යාපාරික කටයුතු එදා හා අද ගත් කල තිබෙන තාක්ෂණික දියුණුව ගැන සුළුකොට තකන්නට බැහැ. වර්තමාන ආර්ථික තත්ත්වය තුළ බොහෝ ආයතන වල මුලින්ම කරන්නේ දැන්වීම් ප්‍රචාරණය මත වන වියදම් අඩු කිරීමයි. ඉතින් එවැනි තත්ත්වයක් තිබුණද එදිනෙදා එන ගැටළුවලට මුහුණ දෙමින් ව්‍යාපාර කටයුතු කරගෙන යෑම ම අභියෝගයක් නමුත්, ව්‍යාපාරය මේ තිබෙන තැන පිළිබඳව ඇත්තටම මම සතුටු වෙනවා.

**02) මෙවැනි ක්ෂේත්‍රයකට යොමු වුනේ කොහොම ද ?**

මේ ව්‍යාපාරයට මූලික අඩිතාලම මගේ පාසල හරහා ලැබුණ බව කිව යුතුමයි. පාසලේ නියැළුණු විෂය බාහිර ක්‍රියාකාරකම් සහ සහජ කුසලතාවයත්, මුද්‍රණ ක්ෂේත්‍රයේ ඇති වූ වේගවත් දියුණුවත් සමගම එම විෂයට ඇති කුතුහලය සංසිඳුවා ගැනීමේ අරමුණත් මේ ක්ෂේත්‍රයට පිවිසීමට තවත් හේතුවක් වුණා. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේ ම විවිධ පාඨමාලා හදාරමින් දැනුම යාවත්කාලීන කර ගනිමින් කාලය, ධනය හා ශ්‍රමය වැය කරමින් විවිධ අත්හදාබැලීම් කරමින්, අත්දැකීම් ලබමින් තමයි මේ ක්ෂේත්‍රයේ වර්තමානය දක්වා සාර්ථක ගමනක් එන්නේ.




**03) පාසල් කාලය තුළ තරමක දඩබ්බර චරිතයක් කියලා තමයි අපිට ආරංචි. පාසලේදී සිදුකල විෂය බාහිර ක්‍රියාකාරකම් හා ක්‍රීඩා පිටිය තුළ ඔබතුමා ලැබූ ජයග්‍රහණ මොනවා ද ?**

එහෙම ලොකු දඩබ්බරකම් කලා කියලා පෞද්ගලිකව එදා මට හැඟුනේ නෑ, පාසල තුළ මොනයම් කටයුත්තකට හෝ එදා මම මුහුණ දුන් ආකාරය හා ප්‍රතිචාර දැක්වූ ආකාරය මත පිටතින් බලන කෙනෙකුට මා විසින් ක්‍රියා කළ අයුරු දඩබ්බර යැයි හැඟෙන්නට ඇති.

පාසල් කාලය ගැන හැරී බැලූ විට ඒ වසර 13 ක කාලය ඇතුළත විෂය අනුබද්ධිත ක්‍රියාකාරකම් වලට වඩා විෂය බාහිර ක්‍රියාකාරකම් වල යෙදුනා





කීවොත් මා නිවැරදියි. පාසලේ මලල ක්‍රීඩා කණ්ඩායම, වොලිබෝල්, ක්‍රිකට්, එල්ලේ, පාපන්දු, රගර් වැනි කණ්ඩායම් ක්‍රීඩා නියෝජනය කළ අතර ම සාහිත්‍ය සංගමය, වාණිජ සංගමය, පරිසර සංගමය, අමද්‍යප සංගමය, සෞඛ්‍යදාන ඒකකය වැනි කණ්ඩායම් හා සංගමයන් හට නායකත්වය ලබා දෙමින්, නිල තල දරමින් කටයුතු කළා. පාසලේ ක්‍රීඩා කටයුතුවලදී

නිවාසාන්තර, කොට්ඨාස, කලාප, පළාත් ජයග්‍රහණයන් ලැබූ අතර පාසල නියෝජනය කරමින් සමස්ත ලංකා තරගවලට සහභාගී වුණා. 2003, 2004, 2005 වසරවල ජාතික මැරතන් තරගාවලිය ජයග්‍රහණය කළ අතර 2003-2005 වර්ෂවල ජාතික මලල ක්‍රීඩා පුහුණු සංචිතයත් නියෝජනය කළා.

## 04) ඕනෑම දෙයක් පටන් ගන්න ගොඩක් අමාරුයි. පෙරමග ආරම්භයේදී ඔබ ඇතුළු කණ්ඩායමට පැමිණි අභියෝග මොනවාද?

පාසලේ නව ආදි ශිෂ්‍ය කණ්ඩායමක් පිහිටුවීමට අවසර ගැනීම හිතන තරම් පහසු වුණේ නැහැ. එකල සිටි විදුහල්පතිතුමා හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිතුමා වසරක් පමණ කාලයක් ඇතුළත තෙවතාවක් පමණ මුණගැසී එතුමන්ගෙන් අනුමැතිය ලබා ගැනීම, ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යුහය හඳුනාගැනීම, කණ්ඩායමේ වසර කාල පරාසය තීරණය කිරීම වැනි කරුණු කාරණා මුලින්ම අභියෝග ලෙස මුණ ගැසුණා. ඉන් පසුව වසර 06 ක පමණ විදුහලින් පිට වූ ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලිපි තැපැල් කර සම්බන්ධ කර ගැනීම මෙන්ම ඒවාට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සපයා ගැනීම පවා එකළ මුහුණ දුන් අභියෝගයක්.



මොකද එදා අපට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සැපයීමට අනුග්‍රාහකයෙකු සිටියේ නැහැ. පෞද්ගලිකවම මා ඇතුළු මගේ ම පාසලේ සහෝදර සහෝදරියන්ගේ ආර්ථික මට්ටම එච්චර හොඳ තත්ත්වයක පැවතියෙත් නෑ. එයට හේතු වූයේ අප පාසලෙන් ඉවත් වී වසර කිහිපයක් ගත වීමත්, බහුතරයක් දෙනා උසස් අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වීමත්.

ආරම්භක මහා සභාවට ආදි ශිෂ්‍යයන් කැඳවා ගැනීම, ආරම්භක මහා සභාවේ දී කණ්ඩායමට නමක් යෝජනා කර ස්ථිර කර ගැනීම, වැනි අභියෝග රැසකට මුහුණ දුන්නා. අවසානයේ දී 150 ක පමණ වාර්තාගත ආදි ශිෂ්‍ය ශිෂ්‍යා සහභාගීත්වයකින් අප සංගමයේ සමාරම්භක මහා සභාව පැවැත්වුණා. පසුව අප කණ්ඩායමේ නාමය තීරණය කිරීමට පොදු යෝජනාවක් ලෙස අප පාසලේ නියෝජ්‍ය විදුහල්පති ලෙස වැඩම කර සිටි රේරුකන ගම සද්ධානිස්සර ස්වාමීන් වහන්සේට භාර වුණා. උන්වහන්සේ අපගේ දශක කණ්ඩායම් නමෙහි නිර්මාතෘ ලෙස හදපිරි ගෞරව ශීර්ෂ ප්‍රණාමව සිහිපත් කරන්න කැමතියි.



## 05). එදා මෙන්ම අදත් ඔබ පෙරමග සමග එකට බැඳී කටයුතු කරනවා. එදා සහ අද පෙරමග ගැන ඔබගේ අදහස කුමක් ද?

මම මුලින් ම කිව්ව විදියටම එදා අපට තිබුණු ප්‍රධානතම ප්‍රශ්නය තමයි ආයෝජනය සඳහා මූල්‍ය ශක්තියක් නොමැති වීම. එදා සිටි අත්දැකීම් අඩු දශක කණ්ඩායම වූ අපට තිබූ විශාලම ශක්තිය තමයි අපගේ සාමාජික පිරිස. අපේ එකමුතුවෙන් වසරින් වසර විවිධ ව්‍යාපෘති සාර්ථක කරගනිමින් හා සංගමයට නවක සහෝදර සහෝදරියන් සම්බන්ධ කරගනිමින්, අපි පෙරමග ගොඩනැගුවා.



අද මට හැඟෙන අයුරින් පෙරමග කියන්නේ ආදි ශිෂ්‍ය සංගම් ව්‍යුහයෙන් මූල්‍ය ශක්තිය මෙන්ම වැඩිම පිරිසක් නියෝජනය කරන දශක කණ්ඩායම් අතර ඉදිරියෙන්ම තියෙන නාමයක් කිව්වොත් මම නිවැරදියි. එයට ප්‍රධාන හේතු සාධකය වූනේ වසරින් වසර නව සභාපතිවරයෙක් ඇතුළුව නව නිලධාරී මණ්ඩලයක් පත්වීමත් සමග නව අදහස් කණ්ඩායම තුළට පැමිණීමයි. අදට පෙරමග පටන්ගෙන වසර 15 ක් ගතවුවත් එදා තිබූ ජවයම අප දශක කණ්ඩායම සතුවීමේ සුවිශේෂී රහස එයයි.

## 06). පෙරමග දශක කණ්ඩායම ගැන ඔබගේ අනාගත බලාපොරොත්තුව කෙබඳුද ?


ඇත්තටම අපි හැමෝගෙම දැක්ම විය යුත්තේ පෙරමග තුළින් ශිෂ්‍ය සහ ආදි ශිෂ්‍ය සුභසාධනයයි. නමුත් ආදි ශිෂ්‍යයන් ලෙස අප පාසලෙන් ලබාගත් සියළු දේට, අප පාසලට යමක් කළ යුත්තේ ලාබ ප්‍රයෝජන බලාගෙන නොවේ. එම නිසා මා දකින අන්දමට පෙරමග මෙතෙක් පැවති අයුරින්ම පාසලට තවදුරටත් සවියක් වන ආදි ශිෂ්‍යයන්ගේ එකමුතුවක් විය යුතුය. එමෙන්ම පාසලේ අධ්‍යාපන, ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් විශිෂ්ට පාසලක් රටට දැයට දායාද කරමින් දම්පල් කීර්තිය විදහා දැක්වීමට අප සැවොම එක් වී එකා මෙන් කටයුතු කළ යුතුය.

**ඉතාමත් රසබර පිළිසඳරක අවසානය සනිටුහන් කරමින් එදත් අදත් පෙරමග හා බැඳුණු ලෙන්ගතු සිත දමා එනු ලොබින්, නමුදු කෙටි සමුගැනීමක් පමණක් සනිටුහන් කරමින්, අප සහෘදයාට සුභ පතමින්, ඔහුගේ නිවසින් නික්මුණෙමු.**


**ගයනි වත්සලා විජේකෝන්**



M-034
ප්‍රාණ
Praana
Drink Praanaa and stay safe
Proven by laboratory tests carried out at the University of Peradeniya.
Quality proven by ITI research reports.
Cargills
ARPICO SUPERCENTRE
softlogic GLOMARK
It's never a bad idea to keep your Immunity Boosted !
www.praanaa.lk
www.ceylongreenayurveda.com
www.cargilsonline.com
Contact us for doorstep delivery
077 200 7566

M-004
Best wishes from
Indunil Ayoshika Perera
2007 A/L

With best complements from ...
exceed prosthetics & orthotics EXPECT MORE
Exceed Lanka (Private) Limited
Clinic/Office Address
168 Kadawatha Road, Ragama, Gampaha 11010, Sri Lanka
Email: srilanka@exceedclinics.com
Landline: +94 11 2959544 Fax: +94 11 2959322
කොඳු ඇට
පෙළෙහි ඇදවීම්
සඳහා ආධාරක උපකරණ
(Scoliosis braces)
කෘතීම පාද හා ආධාරක (Artificial limbs)
සඳහා ප්‍රමුකයෝ,
මූලික පරීක්ෂණ හා උපදේශන සේවා නොමිලේ
ලබාගැනීමට Tel :074-2601144, 071-8239359




M-008
MIRACLE
BEYOND IMAGINATION
MIRACLE CREATIVE SOLUTIONS (PVT) LTD,
143, 4th Floor, Mount City, Rathmalana,
Sri Lanka.
Contact: 0773 709361
info@miraclecreatives.com
www.miraclecreatives.com




M-011

# Sinelya Audio & Event Solutions

**Sounds & Lighting for**

**Total Event Solutions**


- Weddings
- Birthday Parties
- Night Parties
- Opening Ceremonies
- Office Parties
- Office Conferences
- Multimedia Projectors & Screens
- Almsgiving & Dharma Deshana Pinkam

**Dhammika Mallikarachchi**
Proprietor
**0776 874 526**

No: 1070/1E/1,
Liyanagoda, Pannipitiya.
E-mail. audiosinelya@gmail.com

Music Band (4 piece, Classical & Paduru Party Band)






පහළොස් වසරක

# මතකාවර්ජන .....


















**2007 - 2008**

- සංගමය ආරම්භ කිරීම හා පෙරමග නම, ලාංඡනය සකස් කිරීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය ආරම්භ කිරීම.
- රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.
- ධර්ම දේශනා වැඩසටහනක් සංවිධානය කිරීම.

**2008 - 2009**

- සම්ප්‍රදායික ශාන්තිකර්ම ඇසුරින් "දම්පල් පාලිය" ශාන්තිකර්මය පැවැත්වීම.
- peramaga.org වෙබ් අඩවිය ආරම්භ කිරීම.
- පෙරමග සුහද හමුව පැවැත්වීම.
- සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- උසස් පෙළ සිසුන් සඳහා විභාග සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම.

**2009 - 2010**

- "දම්පල් පාලිය" ශාන්තිකර්මය පැවැත්වීම.
- සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- පාසලේ සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබාදීම.

**2010 - 2011**

- පිහිණුම් තටාකය සඳහා මූල්‍යමය දායකත්වය සැපයීම.
- ධර්ම දේශනා මාලාවක් පැවැත්වීම.
- රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.

**2011 - 2012**

- අභිප්‍රේරණ වැකි සහිත පුවරු සවිකිරීම.
- පාසල් සිසුන් හා ආදි සිසුන් සඳහා ධර්ම දේශනා වැඩසටහන් පැවැත්වීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- වාර්ෂික සුහද හමුව පැවැත්වීම.

**2012 - 2013**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "Marians Unpluged" පළමු ගෘහස්ත සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය සඳහා මූල්‍යමය දායකත්වය ලබාදීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- වාර්ෂික සුහද හමුව පැවැත්වීම.
- උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසු සිසුවියන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ළමා අපචාර මැඩලීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

**2013 - 2014**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස Marians Jothi & Clarence සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය ආලෝකකරණය සඳහා මූල්‍යමය දායකත්වය ලබාදීම.
- ධර්ම දේශනා මාලාවක් පැවැත්වීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- රුක් රෝපණ වැඩසටහන පැවැත්වීම.
- උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසු සිසුවියන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- සිල්සමාදන් වූ පිරිස සඳහා බෞද්ධ පුවත්පත් බෙදා දීම.
- දම්පල් ඇදුරු උයන හා ආදි සිසු සෙවණේ භූමි අලංකරණය.
- ආදිශිෂ්‍ය සංගම් කාර්යාලයේ නඩත්තු කිරීම් කටයුතු සිදුකිරීම.
- පෙරමග සාමාජිකත්ව නාම ලේඛණයක් සැකසීම ආරම්භ කිරීම.

**2014 - 2015**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "Marians Back to 70's" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධන කටයුතු සඳහා මූල්‍යමය දායකත්වය ලබාදීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- කඹරව කනිෂ්ඨ විද්‍යාලයට පාසල් උපකරණ බෙදාදීම.
- මියගිය ආදි ධර්මපාලීයයන් සිහිකර දානමය පිංකමක් සිදුකිරීම.
- සිල් සමාදන් වූ පිරිස සඳහා "මහමේඝ" බෞද්ධ පුවත්පත් බෙදා දීම.

**2015 - 2016**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "Marians Unplugged with Athma" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- විද්‍යාලයීය ගණිතාගාරය ඉදිකිරීම.
- 75 වන සංවත්සර සැණකෙළියේ විනෝද ක්‍රීඩා අංශය සාර්ථකව මෙහෙයවීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.

**2016 - 2017**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "CT Show by Marians" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- ඇහැළියගොඩ ප්‍රදේශයේ පාසලකට ගංවතුර ආධාර ලබාදීම.

**2017 - 2018**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "අපි කවුරුද" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- වාර්ෂික සුහද හමුව පැවැත්වීම.
- දසවැනි සංවත්සර සැමරුම සිදු කිරීම.
- ගංවතුරෙන් හානියට පත්වූ පාසල් කිහිපයකට සහනාධාර ලබාදීම.

**2018 - 2019**

- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "ARCH Coloured by Daddy" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- 6-9 ශ්‍රේණි සඳහා සියලු පහසුකම් වලින් සමන්විත වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.
- භාවිතයට නොගෙන ඉවත්කර තිබූ මේස පුටු අලුත්වැඩියාව.
- දකුණු කොළඹ ශික්ෂණ රෝහලට එක්ස්රේ බහාලුම් පරිත්‍යාග කිරීම.
  සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- ධර්මපාල-රාහුල මහා ක්‍රිකට් තරගාවලිය සඳහා දායකත්වය දැක්වීම.
- දම්පල් පා ගමන සඳහා ශ්‍රම, මූල්‍යමය සහ බුද්ධිමය යන ආකාරයන්ගෙන් දායකත්වය දැක්වීම.










**2019 - 2020**

- විද්‍යාලයේ වාර්ෂික ක්‍රිකට් තරගාවලිය පැවැත්වූ දින 03 පුරාවට පෙරමග දායකත්වයෙන් අවන්හලක් පැවැත්වීම.
- Peramaga Membership Hut සහ Peramaga Canopy hut සැකසීම.
- පළමු පෙරමග සඟරාව එළිදැක්වීම.
- පරිගණක විද්‍යාගාරය අසල දැල් වැට ප්‍රතිසංස්කරණය කිරීම.
- පෙරමග පොකුර ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස "අනාගතයේ Coloured by Wayo" සංගීත ප්‍රසංගය පැවැත්වීම.
- 6-9 ශ්‍රේණි සඳහා ඉදිකළ වැසිකිළි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.
- ගණිතාගාරය "ගණිත චිත්‍රාගාරය"ක් දක්වා වැඩිදියුණු කිරීම.
- උසස් පෙළ විද්‍යා හා ගණිත විද්‍යාගාර සඳහා අවශ්‍ය විද්‍යාත්මක උපකරණ හා රසායන ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- අබලන්ව පැවති මේස පුටු විශාල සංඛ්‍යාවක් අළුත්වැඩියා කර විද්‍යාලයට භාර දීම.
- විද්‍යාලයීය දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයින් දෙදෙනෙකු හට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාදීම.
- වාර්ෂික සුහද හමුව පැවැත්වීම.
- Mini Netball තරගාවලිය සඳහා මූල්‍යමය අනුග්‍රහය ලබාදීම.
- විද්‍යාලයීය ප්‍රධාන ගේට්ටුවේ සිට ප්‍රධාන ශාලාව දක්වා වූ දැල් වැට ප්‍රතිසංස්කරණය කිරීම.
- ආර්ථික අපහසුතා ඇති දරුවන් හට ශිෂ්‍යත්ව ලබා දීම.
- ආදි ගුරු මව් පියවරුන්ගේ දුරකතන නාමාවලියක් මුද්‍රණය කිරීම සඳහා මූල්‍යමය අනුග්‍රහය ලබාදීම හා ගුරු සංකලන ප්‍රසංගය සඳහා මූල්‍යමය දායකත්වය ලබා දිම.
- රගර් ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූල්‍යමය අනුග්‍රහය ලබාදීම.
- රුවන් වැකි සහිත නාම පුවරු අළුත්වැඩියා කිරීම හා නව පුවරු ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රධාන ශාලාවේ අළුත්වැඩියා කටයුතු සඳහා පෙරමග දායකත්වය ලබාදීම.
- ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුල සඳහා පෙරමග දායකත්වය ලබාදීම.
- පාසල ඉදිරිපිට ඇති දැන්වීම් පුවරු ප්‍රතිසංස්කරණය කිරීම.
- විෂයානුබද්ධ පොත් පත් පාසල් ළමුන් හට ලබා දීම.
- ආදි ශිෂ්‍ය සංගමය මගින් පැවැත් වූ Black & White සුහද හමුව සඳහා දායකත්වය ලබා දීම.
- අනෙකුත් දශක කණ්ඩායම් මගින් පවත්වන ලද සංදර්ශන සඳහා මූල්‍යමය දායකත්වය සහ සහයෝගය ලබා දීම.
- අරලිය කණ්ඩායම මගින් වාර්ෂිකව පවත්වනු ලබන වෛද්‍ය කඳවුර සඳහා අප සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වය ලබා දීම.
- අනු කණ්ඩායම් හා දශක කණ්ඩායම් මගින් පැවැත්වූ ලොතරැයි දිනුම් ඇදීම් සඳහා දායකත්වය ලබා දීම.
- පාසලට අවශ්‍ය වූ හැඳුනුම්පත් මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීම.
- විද්‍යාලයීය වර්ණ ප්‍රදානෝත්සවය සඳහා මූල්‍යමය දායකත්වය ලබා දීම.
- විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ ඇතුලත සහ පිටත බිත්ති පිළිසකර කර කපරාරුව සිදු කිරීම.
- විද්‍යාලයීය ප්‍රධාන ශාලා ප්‍රවේශාගාරයේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම.
- විද්‍යාලයීය කෞතුකාගාරය නිර්මාණය කිරීම සහ එහි වැඩකටයුතු නිම කිරීම.

**2020 - 2021**

- විදුහල්පති නිළ නිවස අළුත්වැඩියාව.
- ආදි ශිෂ්‍ය සංගමය විසින් ආරම්භ කල "දම්පල් සවිය" ව්‍යාපෘතියට දායකත්වය දැක්වීම.
- ආපන ශාලාවේ පිටුපස තාප්පය පිළිසකර කිරීම හා එම ගොඩනැගිල්ලේ පඩිපෙළ දෙපස පින්තාරු කිරීම.

















- අබලන්ව තිබූ මේස පුටු අළුත්වැඩියාව.
- ක්‍රීඩා ගොඩනැගිල්ලේ පොත් පිළිවෙලකට සකස් කිරීම.
- පළමු කොවිඩ් රැල්ලෙන් පසුව පාසැල ආරම්භ කිරීමට අවශ්‍ය විෂබීජහරණ උපකරණ ලබාදීම සහ ශ්‍රම දායකත්වය සැපයීම.
- මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මාස්ක් ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- පෙරමග පොකුර යාවත්කාලීන කිරීම.
- පෙරමගින් පෙරමගට සාමාජික සුභසාධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පෙරමග සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- ක්‍රීඩාංගනයේ ඇතුලු කාමරයේ සහ ක්‍රීඩා මණ්ඩපයේ වහලයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.
- අවශ්‍යතා සහිත දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම.
- ලෝක ළමා දිනය වෙනුවෙන් පාසලට පෙරමග දායකත්වය ලබාදීම.
- පුස්තකාලයේ තීන්ත ආලේප කිරීම හා පොත් ලැයිස්තුගත කිරීම.
- ව්‍යායාම මධ්‍යස්ථානයට මුල්ගල තැබීමට පෙර එම ස්ථානය අවට පිරිසුදු කිරීම, තීන්ත ආලේප කිරීම හා ප්‍රචාරණ පුවරු සවි කිරීම.
- පාසල තුළ පළතුරු පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් සිදු කිරීම.
- සුගතපාල මහතාගේ කාමරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
- ශ්‍රවණාගාරයේ සහ ළමා පුස්තකාලයේ අබලන් වූ කුෂන් පුටු නැවත පිළිසකර කිරීම හා මේස අළුත්වැඩියා කිරීම.
- පෙරමග පසු විපරම ක්‍රියාත්මක කිරීම.
- පාසලේ විෂබීජහරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබාදීම.
- පෙරමග වාර්ෂික සඟරාව ප්‍රකාශයට පත් කිරීම.

2020 - 2021

- වෙළඳ භාණ්ඩ එකතුවකින් යුත් "Merch Pack" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- තුන්වන වාර්ෂික සඟරාව නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීම.
- "Proud Palian" සම්මුඛ සාකච්ඡාව Youtube වීඩියෝවක් ලෙස ඉදිරිපත් කිරීම.
- සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම.
- මූල්‍ය උත්පාදනය උදෙසා T-Shirt සහ මුව ආවරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ආදි ශිෂ්‍ය සංගමයේ සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රයෝජනය සඳහා ප්‍රක්ෂේපන යන්ත්‍රයක්, තිරයක් සහ ශ්‍රව්‍ය පද්ධතියක් සවිකිරීම.
- පෙරමග වෙබ් අඩවිය යාවත්කාලීන කර නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීම.
- කාලයක් භාවිතා කල Facebook, Viber සමාජ ජාලා වලට සමගාමීව Youtube,Instergram,Whatsapp සමාජ මාධ්‍යයන් ආරම්භ කිරීම.
- ව්‍යාපෘති අවසානයේ ඉතිරිවන අමුද්‍රව්‍ය සහ උපකරණ ගබඩා කිරීම සඳහා පෙරමග ගබඩා කාමරයක් සැකසීම.
- විද්‍යාලයීය ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ, පරිගණක විද්‍යාගාරයේ සහ එම ගොඩනැගිල්ලේ තරප්පු පේලියේ බිත්ති අලුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම.
- පුස්තකාලය අසල අබලන්ව තිබූ, 10-11 වසර සඳහා වෙන්කල වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කර පාසලට භාරදීම.
- ධර්මපාල මාවතට යාබද පිට්ටනියේ බෑවුම සේදීයාම වැලැක්වීම සඳහා බෑවුම සකස්කිරීම.
- ක්‍රීඩා උපකරණ සහ වැඩපොත් කට්ටල පාසලට ලබාදීම.
- ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ ජන්මදින සැමරුම වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කළ උත්සවය සඳහා දායකත්වය ලබාදීම.
- ජාතික ජිම්නාස්ටික් ක්‍රීඩකයෙකු ලෙස අප පාසල නියෝජනය කරමින් බංගලාදේශයේ ඩකා නුවර පැවති තරගාවලිය සඳහා සහභාගී වූ රවිඳු සසංක ශිෂ්‍යා හට මූල්‍යමය අනුග්‍රහය දැක්වීම.

2021 - 2022











- ආදිශිෂ්‍ය කාර්යාලය සඳහා Dot Matrix මුද්‍රණ යන්ත්‍රයක් ලබාදීම.
- දම්පල් Leo Club සමාජ සත්කාර සඳහා සහයෝගය ලබාදීම.
- සුගතපාල මහතාගේ නිවසේ සිවිලිම සවිකිරීම.
- අබලන් පුටු සහ මේස පිළිසකර කර නැවත පාසලට භාරදීම.
- අධ්‍යාපන සහ ක්‍රීඩා දක්ෂතා සහිත ආර්ථික අපහසුතා වලින් පෙලෙන සිසු සිසුවියන් සඳහා "ඉගෙනුමට සවියක්" ව්‍යාපෘතිය මගින් ශිෂ්‍යත්ව මුදල් ලබාදීම.
- හරිත ව්‍යාපෘතිය යටතේ මල්පැල නඩත්තු කිරීම හා ක්‍රීඩාපිටිය අසල පලතුරු පැල සිටුවීම.
- පාසල් භූමිය නඩත්තු කිරීමේ කටයුතු වලට සහ පාසැල් අලංකරණ කටයුතු වලට දායක වීම .
- පෙරමග සමාජ සත්කාර පළමු අදියර යටතේ පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් දෙපලකගේ නිවාස අලුත්වැඩියා කර දීම.
- පෙරමග සමාජ සත්කාර දෙවන අදියර යටතේ මොණරාගල බඩල්කුඹුර මඩුකොටංඅරාව මහා විද්‍යාලයේ සිසු සිසුවියන් සඳහා අභ්‍යාස පොත් ඇතුලු පාසල් උපකරණ ලබාදීම.
- වෙසක් සහ පොසොන් පොහොයන් වෙනුවෙන් පහන් කූඩු ප්‍රදර්ශනය.
- පුස්තකාලයේ දත්ත යාවත්කාලීන කිරීම.
- "පෙරමග පොකුර" ව්‍යාපෘතිය යටතේ සාමාජික දත්ත යාවත්කාලීන කිරීම.
- විෂබීජහරණ සහ සෞඛ්‍යාරක්ෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය සහ උපකරණ ලබාදීම.
- පෙරමග පසු විපරම ක්‍රියාත්මක කිරීම.
- මුල්‍ය ව්‍යාපෘතියක් වශයෙන් මුව ආවරණ ව්‍යාපෘතිය සිදු කිරීම.
- ව්‍යවස්ථා සංශෝදන කමිටුව පිහිටුවීම සහ එහි කටයුතු සිදුකර ගෙන යාම.
- පාසලේ විශබීජහරණ සහ සෞඛ්‍යාරක්‍ෂණ ක්‍රියාවලිය සඳහා දායක වීම.
- ක්‍රීඩා පිටිය අසල පැති බැම් ඉදි කිරීම සඳහා දායක වීම.
- පාසලේ මාධ්‍ය ඒකකයේ වායු සමීකරණ අලුත්වැඩියා කිරීම.
- පෙරමග සාමාජිකයන් සඳහා අවුරුදු සුභ පැතුම් පත් තැපැල් කිරීම.
- ආදි ශිෂ්‍ය සංගමය විසින් ක්‍රියාත්මක කාය වර්ධන මධ්‍යස්ථානයේ වැඩ කටයුතු සඳහා දායක වීම.
- ආදි ශිෂ්‍ය සංගමයේ සහ සංසද දශක කණ්ඩායමේ ලොතරැයි දිනුම් ඇදීමේ ව්‍යාපෘති සඳහා දායකත්වය දැක්වීම.
- පාසලේ ඉදිරිපස බස් නැවතුම්පළක් ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

2021 - 2022

















උදාර කත්‍රිආරච්චි


M-024
GENERAL PURPOSE
CEMENT
WASANAA IMPEX
General Hardware Merchants,
Suppliers of All Type of Hardware Items,
Electrical Goods, Spare Parts & Mechanical Items,
Repairing of all Type of Electrical,
Electronic & Mechanical Items
No. 30, 2nd Floor, Abdul Jabbar Mawatha, Colombo – 12.
Tel: 011-2433944 / 071-2124450


M-023
Chello Dairy Products (pvt)ltd.
Chello
MILK
The taste of pasteurized
Fresh Milk
DOOR 2DOOR
vijitha
076 53 56 566
නැවුම් එළකිරි
Mawathgama,Homagama


M-022
NILAKSHI
DANCING ACADEMY
MAHARAGAMA
Nilakshi
DANCE ACADEMY
එන්න අප හා එක්වන්න.
නර්තනයෙන් ශාස්ත්‍රීය හා ශිල්පීය කුසලතා වර්ධනය
කර ගැනීමටත්, නිරන්තර පුහුණුවෙන් පසු
ප්‍රාසංගික රඟමඬලක රංගනයේ යෙදෙන්නට
සෑම සෙනසුරාදා දිනකම
10.00 am - 12.00 pm - උඩරට නර්තනය
1.00 pm - 3.00 pm - පහතරට නර්තනය
සෑම ඉරිදා දිනකම
10.30 am - 12.30 pm - පහතරට නර්තනය
මෙහෙයවීම,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
නිලක්ෂි ද අල්විස්
Professional Dancer & Choreographer
(සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය)
Master of Performing Arts (University of Visual and Performing Arts)
Bachelor of Fine Arts (University of Kalaniya)
VISHARAD in Kathak Dance (Laknow - India)
Diploma in Dance Choreography (Sri Lanka Foundation)
0719 99 77 33
0769 66 53 59



Greenland - Piliyandala
Athurugiriya Collection - Athurugiriya
Opesel - Thalawathugoda
Contact Us
@peramaga.dvp
PERAMAGAPPA
SINGER


HUSTLE

# කැටපත් පවුර

සම්බන්ධීකාරක - ඉරේෂා මධුවන්ති

## The Rainy Season

Flocks of rain clouds
Hovering over the mountain tops
Showering the plain fields concurrently
Making me numb and colder

Let there be a fanciful dream
In this drizzly season of rains
Waiting for a glimmering hope
To give me a better tomorrow

The autumn rain was pale and sick
But it is full and alive again in summer
Life is tough, yes, it is
But the fight keeps continuing
To bloom on another sunny day

Hiyal Chathura
PLM 809 - 2008 A/L

## මල් කැකුළු

පාට ගැවුණු
සුවඳ තැවරුණු...
අවැසි ඉඩකඩ ලබා දිය යුතු වේ
සෙනෙහෙ දිය සහ අදරැති
උණුසුම් රැකවරණය සමග...
විකසිත වන්නට
හෙට ලොවට නිදැල්ලේ
නේක පාටින් සේම සුවඳින්...
දරුවන් රැකිය යුතුමය
රිසි තැනෙක පිපෙනා තුරාවට
විස බඹර තුඩු නොවැදෙනා ලෙස..

තුෂානි පෙරේරා
PLM 164 - 2007 AL

## පේරමගින් විදු මවුට,

අරලියා පියස යට
කිචි බිචි හිනා මැද
මිතු දමින් බැඳී ගිය
අපේ සිත් තවම ඇත..
දම්පල් මවුනි ඔබ
කිසි දිනක තනිව නැත
ඔබ වෙතම බැඳී ගිය
අප සැවොම එක්ව ඇත..
"පෙරමගින් පෙරමගට"
ඔබ සමග
යනෙනු ඇත...

වයනි වික්‍රමනායක
PLM 994 - 2008 A/L

නුඹව මට ලැබුනු දා
සිප ගත්තේ හෙම්හිට
නුඹට රිදෙයිදෝ සිතා
තුරුල්
කරගත්තෙ
පරිස්සමට
නුඹ
දමා යා
නොහැකි නිසා
අතපසු
උනා මගේ
වැඩ එමට - එත් මගෙ ආදරේ
දැනෙයි නම් නුඹේ හිතට
එයම ඇති මැණික මට
කල්පයක් හිනැහෙන්න

දිලිනි ලාංකිකා
PLM 549 - 2003 A/L

## ගඟේ කතාව

අහස් කුස තුල දිලෙන තරු ඇත
එවන් තරු නැත එළිය දී..
පොළොවතල මත සයුර ඇති මුත්
ඉන් නොවේ තොල සන්සිඳි
වන පුරා මල් රොදින් පිරුනත්
හැම මලක් නැත සුවඳ දී..
කොතෙක් බාධා පැමිණියත්
මග අහුරමින් ලොව කුරිරු වී..
නවත්වන්වට නොහැක කිසි දින
ගලන ගඟ පේරමග ඇදී..

වමිඳු විජයවර්ධන
PLM 205 - 2008A/L

## සොයයි ජීවිතය

සුදු ඇඳුමේ රැළි අතර සැම
සොඳුරු දිවි ගෙවූ අප
නිල ඇඳුම් සාරි ඇඳ
බර අඩියි දිවිය තුළ
ඇසළ අරලිය සෙවණේ
ජීවිතය ගෙවූ සැම
මැකින් ලිපිගොනු අතර
පොර බඳි අප සැවොම
නැටුම් කවි ගී අතර
සැනසුමින් ගෙවූ අප
කසර බස් වදන් මැද
සොයයි ජීවිතය සැම
සෙල්ලම්ද කෙළි කවට
වදන් පොදි සිනා කැට
වියැකෙමින් දිවිය තුළ
මහළුවෙයි අප සැවොම

හංසිනි එරන්දිකා
PLM 632 - 2010 A/L



## යසෝදරාවක් වී - නුඹ හට මා

දෙන්නට බෑ මා - අතහැර යන්නට
ළබැඳිය වී - හිඳිනට පතනෙම් මා
ඇහිපිල්ලම් යට - සෙනෙහසෙ සැගවී
නුඹෙ ආදරෙ නව - විඳිනට අවැසිය
සසර පුරාවට - සැනසී සුසුමේ...
ඉදින්, - සෙනෙහස යදිමින්
නොපෙනෙන දෙවියන් - අදහනු කුමකට
නුඹෙ තරු නෙතු යුග - මා අසලින් කොට..

ගයනි වත්සලා විජේකෝන්
PLM 133 - 2004 A/L



කාටත් වඩා
මට ආදරෙයි කිව්ව
මගේ අම්මි..
ලොකෙටත් වඩා
මට ආදරෙයි කිව්ව
මගේ තාත්ති..
මං පැත්තක
දොයි කරවලා
ඒ දෙන්නත් දොයි...
අම්මි ආදරෙයි තාත්තිට
තාත්ති ආදරෙයි අම්මිට
ඒ දෙන්නම ආදරෙයිනෙ මට...
මම තමයි ඉතින්
එයාලගේ පණ...
දවස පුරාම මාව හුරතල් කරලා
මං නිසා මහන්සි වෙලා
ඒ දෙන්නත් මහන්සියට
දැන් හොඳටම දොයි...
එයාලට වද දීලා මටත් මහන්සියි
හොඳටම...
ඒ හින්දත් මාත් ඉතින් දොයි

රැක්ෂාන් සමරවීර
PLM 562 - 2005 A/L

## කඳුළු වැසි

බිඳෙන් බිඳ එකතු වී
ඇද හැලෙන වර්ෂාව
හරියට මගේ කඳුළු වගේ
සියලු දේ දරාගත්
හදවතින් මතුවෙමින් රිදවමින්
මෝදුවන හැගුමන්
අහස වගේ දරාගන්න
හැකිනම් මටත්
කවදාවත් වහින්නේ
නැතිවෙයි..

නිශාදි රුක්ෂාණි
PLM 056 - 2006 A/L

## සල්

ගසින් පිරි මාවතේ බිම
වැටුනු සල් මල් අහුලලා
පිපෙන අරලිය පොකුරු එක්කම
අපේ කාලය ගත වුණා...

මැයි මලින් ගෙත්තම් කළා වූ
පිට්ටෙය සෙල්ලම් හැඩ වුණා,
ඇහැළ ගස යට තණ පැහැති බිම
සොඳුරු පලසක් මතු කළා...

නැණ ගුණෙන් පිරි ලොවක් තනනට
අපේ ගුරු දෙවියන් එදා
කළා වූ කැපවීම් අදටත්
මතක් වෙනවා සිත පුරා...

සිනහ නැගි කෙළි දෙළෙන් ගත කළ
සොඳුරු එදවස සිහි වෙලා
නෙතට කඳුළක් නැගෙනවා සිටි
යහළුවන් අද කොයි කියා...

යනෙන ගමනේදී නිතර ඔබ දෙස
බලනවා සතුටක් දරා
තවත් සියවස් ගණන් පෙරටම
මවුනි දම්පල් දිනේවා...!

චාමලි නිසංසලා PLM 586 - 2004 A/L

# GAME Zone

## SEARCH FOR THESE WORDS !

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| B | A | I | D | K | I | H | D | H | A | R | M | A | P | A | L | A | N | G | Z | O | J | R | T |
| A | B | F | G | N | Z | J | C | A | L | E | N | D | E | R | A | P | J | A | D | K | H | E | I |
| L | C | J | L | B | R | C | T | D | K | U | F | A | X | O | M | E | H | P | R | S | A | L | M |
| L | D | V | I | D | Y | A | L | A | Y | A | Q | Z | R | C | E | P | L | A | N | E | T | O | E |
| O | E | A | B | F | C | G | M | D | N | K | B | Z | F | K | X | M | C | Q | H | A | Z | D | S |
| O | T | E | L | E | S | C | O | P | E | L | C | N | G | E | B | A | C | K | P | A | C | K | S |
| N | R | N | H | F | C | N | B | C | N | I | P | V | E | T | A | R | H | O | Y | T | Z | P | Q |
| S | M | I | D | J | B | O | C | E | L | E | B | R | A | T | I | O | N | G | B | N | P | L | U |
| H | E | C | L | I | P | S | E | X | M | F | S | Z | B | C | P | X | L | N | J | V | C | O | A |
| G | A | M | E | S | E | B | Q | T | B | R | N | F | A | S | T | R | O | N | A | U | T | X | R |
| A | S | I | R | G | N | O | K | H | A | T | S | K | X | E | D | A | H | F | X | I | M | A | E |
| L | Q | S | G | K | N | R | B | Q | L | U | E | W | N | A | I | G | I | Y | N | H | P | N | X |
| A | S | S | C | L | O | C | K | S | L | Y | M | X | L | D | V | T | Z | C | P | R | R | N | P |
| X | S | I | H | Y | I | Y | V | R | X | D | I | R | F | Z | X | D | R | G | H | T | E | I | B |
| Y | T | O | P | V | S | E | T | C | O | U | N | T | D | O | W | N | V | R | J | O | S | V | X |
| O | Q | N | F | Z | E | U | X | B | H | T | X | A | S | K | P | F | S | B | S | Q | O | E | L |
| S | X | J | I | D | M | K | I | D | R | I | A | P | Y | U | X | A | C | G | E | P | L | R | D |
| T | J | L | Y | J | A | T | N | C | O | N | F | E | T | T | I | W | H | S | U | B | U | S | T |
| U | W | X | K | M | K | R | Y | O | U | E | M | Z | B | W | S | Q | O | V | F | W | T | A | N |
| D | V | Z | R | S | E | J | V | B | S | K | Y | L | A | B | V | C | O | G | C | V | I | R | G |
| E | R | V | W | U | L | W | A | H | C | S | U | K | C | X | Z | W | L | E | M | S | O | Y | R |
| N | P | Q | P | A | R | T | Y | K | Z | W | V | R | Z | J | A | N | U | A | R | Y | N | M | O |
| T | Z | Y | M | R | T | O | D | Q | N | E | Y | I | B | O | X | Y | G | E | N | L | K | Y | P |
| S | V | S | U | N | E | W | Y | E | A | R | T | U | X | B | W | O | P | M | Z | W | R | T | Q |

1. Celebration
2. Balloons
3. New Year
4. Clock
5. Resolution
6. Ball
7. Noisemaker
8. Hat
9. January
10. Calender
11. Countdown
12. Games
13. Party
14. Confetti
15. Times Square
16. Rocket
17. Planet
18. Astronaut
19. Mission
20. Skylab
21. Telescope
22. Galaxy
23. Eclipse
24. Oxygen
25. Backpack
26. School
27. Dharmapala
28. Vidyalaya
29. Students
30. Anniversary

Match these words correctly and send a clear image of this Word Search to peramaga.dvp@gmail.com before 05th of March 2023 Win valuable prizes.



# SPOT THE 10 DIFFERENCES

Spot the 10 differences & send a clear image to **peramaga.dvp@gmail.com** before **05th of March 2023**



# Win valuable prizes



Created by : Achini Liyanage
Nishadi Rukshani

M-025

## YORK HARDWARE (PTE) LTD.

Importers, Dealers in General Hardware & Tools
Authorized Dealer for
DeWALT Black & Decker STANLEY Power Tools




141-G 6, Messenger Street, Colombo 12.
Tel: 0112 478767/4949528/2444269 | Mobile: 0777 745273
Fax: 0112 346767/0114 610910 | E-mail: yorkhardwarepl@gmail.com

## SUPREME CURTAIN MAKERS

Imported Curtains, Fabrics, Curtain Tailoring,
Curtain Poles & Railings, Blindings, Sofa upholstery,
Bed Line & Cushion Covers, Interior Consultation

**Show Room** : 985/1, Thalangama South, Pannipitiya Road, Pelawatta.
**Tel: 0114 403 933**
**Work Shop** : 314/2, Weera Mawatha, Depanama, Pannipitiya.
**Tel: 0710 165 461**
**Open: 10.00 a.m to 7.00 p.m** **Closed Monday & Poyaday**

supremecurtain@gmail.com | www.supremecurtainmakers.com

M-007

*With Best Compliments From*

## Sanjaya De Silva (2005 A/L)

M-006

Best wishes from

## KT COMPUTERS

(The INDEPENDENT Company that helps to
optimize your IT capabilities)



**Tel.0777801978**

email : info@ktcomputers.net
Web : www.ktcomputers.net

M-020

Best Wishes From

## Yashoda Ranmali

2010A/L

M-016

## Warm Wishes!!

Party Deco SrLanka

071 974 0004 /

076 539 6675

Partydeco70

M-032

# OPSEL PHONE (PVT) LTD



No. 837/2B, New Kandy Road, Malabe.
Tel: 0773727726 / 0112185944 / 0112744635
Email: opseloffice469@gmail.com

# 2022 අපේ පුංචි සිත්තරුන් .....

ලෝක ළමා දිනය වෙනුවෙන් පෙරමග විසින් සංවිධානය කළ චිත්‍ර තරඟයේ ජයග්‍රාහී සිතුවම්.



1 ශ්‍රේණිය
හෙසඳු මෙත්සර විජේගුණවර්ධන **(1-B)**



2 ශ්‍රේණිය
අයුනි වොහාරා වීරබද්දන **(2-F)**




3 ශ්‍රේණිය
චනුග චමාදිත් අලගියවන්න **(3-D)**



4 ශ්‍රේණිය
ඩී. තිනුරි උමේද ගුණරත්න **(4-E)**




5 ශ්‍රේණිය
කේ.එම්. කෙනෝද් තෙව්ජාන් **(5-A)**




M-017
1-5 ශ්‍රේණි පොඩිත්තන්ට
අකුරු පන්තිය
ශිෂ්‍යත්ව පන්තිය
(ගණිතය, ඉංග්‍රීසි, සිංහල )
කල්පනි මිස්
6-11 ශ්‍රේණි
ගණිතය
Commerce
ටිරාන් සර්
විද්‍යාව
තිසර සර්
සිංහල
ඉතිහාසය
ඉරෝෂාන් සර්
ඉංග්‍රීසි
චමුදිනී මිස්
ICT
යොමාන් සර්
උසස් පෙළ
Econ, Accouning, BS, ICT
Bio, Chemestry , Physics
Theory & Revision පන්ති
තිනෙත්මා
දෙපානම
විමසීම් : 0770 490 217


M-030
DAT TECHNOLOGIES
Your Total IT Solution Provider
We Visit for Your Door Step & To Your Work Place
or Just Hand Over It To Us.
Professional Service
Exceptional Quality And Reliabillity
Resalable Amount
Laptop & Desktop Services and Repairing
Printers And Ups Repairing
Computer Network
CCTV Installation
Windows Licensing Installed
Virus Gurd Licensing Installed and Virus Removed
Hard Disk Data Recovery
Customer Software Devoloping
Web Developing
Professionals Sound & Lighting Hiring
Contact : Dinesh 0773 278890
All Kind Support, Service At Your Doorstep.


M-018
sat
Laptop එකේ Virus නිසා
Campus වැඩ
අතපසු වෙනවද?
ඔයත් අදම
Kaspersky
Internet Security
එක්ක බය නැතුව
වැඩ කරන්න
kaspersky
Internet
Security







# පෙරමග වාර්ෂික සඟරාවේ

### සිව්වන වෙළුම නිකුත් කිරීම සඳහා

**උපදෙස් ලබාදුන්**

• ගරු විදුහල්පතිතුමිය වන එම්. රූපසිංහ මහත්මියට, ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති දීපාල් හේරත් මහතාට, ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් රොහාන් වැලිවිට මහතාට, ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජ්‍ය ලේකම් ආසිරි ද සොයිසා මහතාට,

**සඟරා ව්‍යාපෘතිය මෙහෙය වූ, පෙරමග දශක කණ්ඩායමේ**

• සභාපති චමිඳු විජයවර්ධන මහතාට සහ පෙරමග දශක කණ්ඩායමේ ලේකම් තිළිණි ශපාලිකා තිලකරත්න මහත්මියට,

**වෙළඳ දැන්වීම් සම්බන්ධීකරණය කළ**

• යසන්ත ඉන්දීවර මහතාට, චාමලී නිසංසලා මහත්මියට, ඉරේෂා මධුවන්ති මහත්මියට, අචිනි ලියනගේ මහත්මියට, ගයනි වත්සලා විජේකෝන් මහත්මියට,

**මූල්‍ය කටයුතු කළමණාකරණය කළ**

• පෙරමග දශක කණ්ඩායමේ භාණ්ඩාගාරික සාරංග පීරිස් මහතාට සහ උප භාණ්ඩාගාරික අෂාන් කළුබෝවිල මහතාට,

**ග්‍රැෆික් නිර්මාණ කටයුතු සිදුකල**

• නිෂාදි රුක්ෂානි මහත්මියට සහ ප්‍රියදර්ශනි පත්මිලා මහත්මියට,

**විශේෂාංග ලිපි සැකසූ**

• චමිඳු විජයවර්ධන මහතාට, තිළිණි ශපාලිකා තිලකරත්න මහත්මියට, යසන්ත ඉන්දීවර මහතාට, ගයානි කොස්වත්තගේ මහත්මියට, දිනේෂා ජයමාන්න මහත්මියට, උදාර කත්‍රිආරච්චි මහතාට, චාමලී නිසංසලා මහත්මියට, හියල් බියමගේ මහත්මයාට, සම්පත් උදයංග මහතාට, ඉරේෂා මධුවන්ති මහත්මියට, අචිනි ලියනගේ මහත්මියට, නිෂාදි රුක්ෂානි මහත්මියට සහ ගයනි විජේකෝන් මහත්මියට

**සෝදුපත් පරීක්ෂා කළ**

• බුද්ධික වැලිවිට මහතාට, චමිඳු විජයවර්ධන මහතාට, තිළිණි ශපාලිකා තිලකරත්න මහත්මියට, දිනේෂා ජයමාන්න මහත්මියට සහ හියල් බියමගේ මහත්මයාට,

**අනුශාසක ලෙස කටයුතු කරමින් නොමඳ සහයෝගය ලබාදුන්**

• බුද්ධික වැලිවිට මහතාට,

**පෙරමග දශක කණ්ඩායමේ**

• 2022 - 2023 පරිපාලන වර්ෂයේ සියලුම විධායක කමිටු සාමාජිකයින්ට, සහ පෙරමග සඟරාව සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහයෝගය ලබාදුන් සියලුම පෙරමග සාමාජික සාමාජිකාවන්ට,

**ලිපිද්‍රව්‍ය සැපයූ**

• ශිවන්ත කොස්වත්තගේ මහතාට,

**ඡායාරූපකරණයෙන් සහයෝගය දැක්වූ**

• මිගාර විජේරත්න මහතාට,

**වෙළඳ දැන්වීම් සඳහා**

• අනුග්‍රහය ලබාදුන් අනුග්‍රාහක භවතුන්ට හා සම්බන්ධීකරණය කළ සියලුම නිලධාරීන්ට,

**මූල්‍යමය දායකත්වය ලබාදෙමින් ශක්තියක් වූ** සාමාජික සාමාජිකාවන් සියලු දෙනාට,

**විශේෂාංග ලිපි සඳහා සහභාගී වූ**

• ආදි ධර්මපාලයීයන් වන යමුනා ආරියසිංහ ගුරු මෑණියන්ට, ගයාන් රුක්ෂාන් මහතාට, සනත් ලසන්ත මහතාට,

**සඟරාවේ ලිපි සඳහා තොරතුරු ලබාදුන්** සියලුම ගුරු මහත්ම මහත්මීන්ට, සහ

• මනා නිමාවකින් යුතුව මුද්‍රණ කටයුතු සිදුකල L S Printing Solution ආයතනයට
• නම් සඳහන් නොවූ පෙරමග සඟරාවට සහයෝගය ලබාදුන් සියලු දෙනාට,

## ඔබෙ‍ෙස් ස්තූතිය පුදකර සිටිමි.

**උදාර කත්‍රිආරච්චි**
**සංස්කාරක**

**පෙරමග සඟරාව**
**ව්‍යාපෘතිය භාර නිලධාරී**

**මෙම සඟරාව පිළිබඳ අදහස්, යෝජනා, චෝදනා ඇත්නම්**

❑ ලේකම්, පෙරමග දශක කණ්ඩායම ❑ යනුවෙන් ආමන්ත්‍රණය කර ලිපියක් මඟින් ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයට ලැබීමට සලස්වන්න.


M-033

# Best Wishes From

# Yasantha Prabath

# Fabric Lanka

Exclusive Collection of Designer Materials




**0713 395 395**

**102, Pamunuwa Road,**
**Maharagama.**